

# වෙළඳ ගිවිසුම් සඳහා තාර්කික ප්‍රවේශය

..ප්‍රතිපත්තින් මත පදනම් වූ යහපාලනයක් සඳහා

විද්‍යාත්මක ප්‍රවේශය..



2016 - ජුනි

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නැති
රටක් වූ ශ්‍රී ලංකාවේ
එම අඩුව සපුරා රට ජාතිය සුරක්ෂිත කරනු වස් බිහි වුවකි........

ජාත්‍යන්තරව සුවිශේෂී පිහිටුමකට

වාසනාව ලත්

අප දේශය

ඒ නිසාම, නිරන්තරයෙන් වූ විදේශ ආක්‍රමණ හමුවේ

අවියෙන් කෙරුණු යුද්ධයන් ජයගත්තත්

ජාත්‍යන්තරය, ආර්ථිකය යොදා ගනිමින් ආක්‍රමණය කරන්නට

සැරසෙන මේ මොහොතේ,

"ඉන්දීය වෙළඳ ගිවිසුම් මගින් නේපාලයට සිදු කල අගතිය,

අප රට තුල සිදු නොවන්නට"

සියලු කුසල සම්පත් ඉස්මතු වී

අප පින්බිමේ

දේශපාලඥයින්ට ප්‍රඥාව පහල වී

රට ආරක්ෂා කිරීමට උපකාරි වන

"ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධයෙන් වූ ජාතික වෙළඳ ප්‍රතිපත්තියක්"

බිහිකර ගැනීමට

හැකිවේවා.

# පටුන

පෙර වදන ........ 6

ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා ගිවිසුමට ඇතුලත් කිරීමට යෝජිත සේවාවන් ........ 8

**I ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වල පසුබිම හා කාර්යභාරය ........ 10**

1.1 රජයක කාර්යභාරය ........ 11

1.2 උගතුන්ගේ කාර්යභාරය ........ 12

1.3 පුරවැසියන්ගේ කාර්යභාරය ........ 12

1.4 දේශපාලන පක්ෂ වල කාර්යභාරය ........ 12

1.5 නේපාලයට සිදු වුයේ කුමක්ද? ........ 13

1.6 ලෝක වෙළඳ සංවිධානයේ ජාත්‍යන්තර වෙළඳ සේවා ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂක හමිඩ් මොම්දෝහ් මහතාගේ නිර්වචනය ........ 14

**II ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් වල ඉතිහාසය හා වර්තමානය ........ 15**

2.1 පුරවැසියා විසින් වෙළඳ ගිවිසුම් පිළිබඳ දැන ගත යුතු කරුණු.. 16

2.2 ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම් ඉතිහාසය ........ 18

2.3 ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් වල වර්තමාන තත්ත්වය ........ 19

2.4 ජාත්‍යන්තර ද්විපාර්ශ්වික ගිවිසුමකට යොමුවිමට පෙර අධ්‍යයනය කල යුතු කරුණු. ........ 21

2.5 මහජනයා නොමග යැවිමට කියන කරුණු හා ඒවාට පිළිතුරු ........ 23

**III ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනිමේ ක්‍රමවේදය ........ 24**

3.1 වෙළඳ ගිවිසුම් ඇති කර ගත යුතු නිවැරදි ක්‍රමය ........ 25

- දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර රටට වාසි වන මගකට යොමු කිරීම ........ 28

- ජාතික වශයෙන් වැදගත් අංශ සුරක්ෂිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම ........ 31
- වෙළඳාම විවෘත වන ක්ෂේත්‍ර වල ආරක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම ........ 32
- වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂිත වන අරමුණු නිර්වචනය කිරීම ........ 34
- ක්‍රියාපටිපාටිය තුල පිළිපැදිය යුතු මූලධර්මයන් ස්ථාපිත කිරීම ........ 34

**IV ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ වගකිම දැරීමේ ආයතන හා පුද්ගලයන් ........ 35**

4.2 සිදු නොවිය යුත්ත ........ 39

4.3 නිදහස් අධ්‍යාපනය සැබෑ අයෝජනයක් විමට නම් ........ 39

ඇමුණුම් ........ 40

**පොත පරිශීලනය කරන අයුරු :**

- **පළමු කොටස** - ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වල පසුබිම හා විවිධ පාර්ශවයන්ගේ කාර්යභාරයන් පිළිබඳවය.
- **දෙවන කොටස** - ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වල ඉතිහාසය හා වර්තමානය පිළිබඳවය.
- **තුන්වන කොටස** - ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳවය.
- **හතරවන කොටස** - ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ වගකිම් දැරීමේ ආයතන හා පුද්ගලයන් පිළිබඳවය.

ISBN- 978-955-1928-12-4
ප්‍රථම මුද්‍රණය (2016)

**ප්‍රධාන කතෘ**

වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය

**කතෘ මණ්ඩලය**

වෛද්‍ය සමන්ත ආනන්ද
වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු
වෛද්‍ය නලින්ද හේරත්
වෛද්‍ය නලින් ආරියරත්න
වෛද්‍ය නවින් ද සොයිසා
වෛද්‍ය හරිත අලුත්ගේ
වෛද්‍ය ලසන්ත විජේසේකර
වෛද්‍ය මුදිත කුඩාගම
වෛද්‍ය සංජීව තෙන්නකෝන්
වෛද්‍ය සාරද කන්නන්ගර
වෛද්‍ය නාත් විජේසූරිය
වෛද්‍ය චන්දන ධර්මරත්න
වෛද්‍ය තාරක ප්‍රනාන්දු
වෛද්‍ය කපිල මල්ලවආරච්චි
වෛද්‍ය අලගයියා ලතාහරන්
වෛද්‍ය බි සායිනිරංජන්
වෛද්‍ය කංචන බුලන්කුලම
වෛද්‍ය රම්‍යා ප්‍රේමරත්න

ජාතික වැටුප් ප්‍රතිපත්තියකින් තොරව අත්තනෝමතිකව වැටුප් වැඩි කිරීම නිසා වෘත්තිය සමිති ක්‍රියාමාර්ග වලින් සෞඛ්‍ය ක්ෂේත්‍රය පමණක් නොව මුලු රටම හෙම්බත් වූ යුගය නිමා කරන්නට ජාතික වැටුප් ප්‍රතිපත්තියක් බිහි කිරීමට අප කල පුරෝගාමී වැඩ පිළිවෙලින් ලත් අත්දැකීම් අනුසාරයෙන් ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳ යෝජනා එළිදක්වමු....

# පෙර වදන

*“දේශපාලන සංස්කෘතිය තුල දේශියත්වය අභිබවා පරගැතිභාවය රජයන බව ප්‍රත්‍යක්ෂ වන කරුණු දිනෙන් දින එළි දකී”.*

ඉන්දියාව, දකුණු ආසියා කලාපයේ ප්‍රධාන බලවතා ලෙස තම බලය පතුරවමින් සිටී. ශ්‍රී ලංකාව ඉන්දියාව ආසන්නයේම ඇති රටකි. අප රට ගෝලිය වශයෙන් ඉතාමත් වැදගත්කමකින් යුතු ස්ථානයක්ව පවතී. ඒ නිසාම අප රට කෙරෙහි ඉන්දියාව අතීතයේ පටන්ම විශේෂ අවධානයක් යොමු කරයි. ඉන්දිය ආක්‍රමණ ගැන අමිහිරි ඉතිහාසයක් ශ්‍රී ලංකාවට ඇත.

අපරට අවුරුදු තිස් ගණනක යුද්ධයකින් පසු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් සිටී. එය වැලැක්වීමට වෙර දරන සතුරන් හඳුනා ගැනීමට අප බුද්ධිමත් නොවුනහොත් නැවතත් අප හට භයානක ඉරණමක් අත්වනු ඇත.

ඈත අතීතයේ බලවත් රටවල් අනිකුත් රටවල් යටපත් කර ගැනීමට අවි බලය යොදා ගැනුනි. උතුරු නැගෙනහිර ඇති කල යුද්ධයද එවැනි කූට උපක්‍රමයකි. එමගින් ඇති වූ හානිය පරම්පරා ගණනාවකට උරුම විය. තවමත් අපි එම පව ගෙවමින් සිටිමු.

බලවත් රටවල් අනෙක් රටවල් යටත් කර ගැනීමට අද භාවිතා කරන නවතම උපක්‍රමය “ආර්ථික යුද්ධයයි” (Economic warfare).

ඒ සඳහා ඇති හොඳම උදාහරණය නේපාලයයි. ඉන්දියාව, නේපාලය සමඟ වෙළඳ ගිවිසුම් කිහිපයකට අවතීර්ණ විය. එකල එම ගිවිසුම් නේපාලය සුඛිත මුදිත කිරීමට ඉන්දියාවෙන් දෙන ආධාරයක් ලෙස ඒත්තු ගැන්වීමට ඉන්දියානු රහස් ඔත්තු සේවය විසින් නේපාල මාධ්‍යය, දේශපාලකයින් හා සමහර විද්වතුන්ව සුක්ෂම ලෙස භාවිතා කරන ලදි. අද නේපාලය ඉන්දියානු යටත් විජිතයක තත්ත්වයට පත්ව ඇත. නේපාල ජනයා නැවත යථාවත්කර ගැනීමට නොහැකි දරුණු ඛේදවාචයකට මුහුණ දි සිටිති.

ශ්‍රී ලංකාවද ඉන්දියාව සමග 1998 ද්විපාර්ශ්වික භාණ්ඩ වෙළඳ ගිවිසුමකට ඇතුලත් විය. එම ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට වූ ආර්ථික පාඩුව ඉතාම අධිකය. එමෙන්ම එමගින් සෙතක් වූ එකම ව්‍යාපාරයක්වත් ශ්‍රී ලංකාව තුල නැත. එමගින් ඉන්දියාව අධික වාසි

ලබමින් සිටී. මෙම ගිවිසුම අත්සන් කල දේශපාලකයින් අද නැත. ගිවිසුම සකස් කල විද්වතුන් විවිධ වරදාන, හා මුදල් ලබමින් අදටත් යහතින් සිටී. වගකිව යුත්තෙක් නැත. එහෙත් අපි, පරම්පරා ගණනක් තිස්සේ වන්දි ගෙවමින් සිටිමු.

එම ගිවිසුම කෙටුම්පත් කල විද්වතුන් යැයි කියා ගන්නා පිරිස අද අපගේ සේවා (රැකියා) වෙළඳපොලද ඉන්දියාවට පූජා කිරීමට අර අඳිමින් සිටිති. දේශපාලකයින්ව නොමග යවමින් සිටී. අප පමණක් නොව අපේ රටේ අනාගතයම ඉන්දියාවට විකිණීමට සියලු කාරණා සම්පූර්ණ කර අවසන්ය.

අනෙක් රටවල, පුරවැසියන් ආරක්ෂා කරගනිමින් වෙළඳ ගිවිසුම් සකස් කිරීමට "වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්" ඇත. දියුණු රටවල පමණක් නොව අප්‍රිකානු රටවලද වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇත. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ජාතික **ප්‍රතිපත්තියක් නැත.** මෙවන් ගිවිසුම් අසාර්ථක වූ විට එයට වගකියන ක්‍රමවේදයක් නැත. ද්විපාර්ශ්වික ගිවිසුම් නිසා ඒවා නැවත අවලංගු කිරීමද කල නොහැක.

ද්විපාර්ශ්වික ගිවිසුම් වලින් අවැඩක් අපට සිදු වන විට ඊට පිහිටවීමට ශ්‍රී ලංකා අධිකරණයට බලයක් නැත. ඒ සඳහා ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය මිල අධික, තාක්ෂණිකව සහ නීතිමය වශයෙන් අපහසු බලවත් පාර්ශවයට වාසි සහගතව නිරන්තරව ක්‍රියාත්මක වන ක්‍රමවේදයකි. ඉන්දියාව ඉදිරියේ අපව අසරණ කිරීමකි. අප, රටක් ලෙස අවාසනාවන්ත ඉරණමකට මුහුණ දෙමින් සිටියි.

ද්විපාර්ශ්වික ගිවිසුමක් ඇති කර ගත යුත්තේ ජාතික ප්‍රතිපත්තියක් හෝ නීතියට අනුවය. නැතහොත් සිදු වන්නේ බලවත් සහ කේවල් කිරීමේ හැකියාව වැඩි පාර්ශවයට වාසි සහගත ලෙස ගිවිසුම් නිර්මාණය වීම බව ගිවිසුම් නීතියේදිද පිළිගත් සිද්ධාන්තයකි.

මේ භයානක උගුලෙන් අප රට බේරා ගත යුතුය. මේ රටේ පුරවැසියන් ලෙස පක්ෂ, පාට, ජාති, ආගම්, උස්, පහත් භේදයකින් තොරව අප එකා මෙන් එක් විය යුතු කාලය එළඹ ඇත. අප විසින් රට නිදහස් කර ගත්තේද, අප සියලු දෙනා භේදයකින් තොරව එක් වී නැගී සිටි නිසාවෙනි. ශ්‍රී ලාංකිකයෙනි එක්වෙමු. සතුරා පරදවමු. මගේ, ඔබේ, අපේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කරමු. එය අප නොකලහොත් කිරීමට වෙනත් කෙනෙකු නැත. අපි සහ අප දරුවන් පාවාදීමට විරුද්ධ වෙමු.

# ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහයෝගිතා ගිවිසුමට ඇතුලත් කිරීමට යෝජිත සේවාවන්

**ශ්‍රී ලංකාව විසින් සැපයීමට සූදානම් යෝජිත සේවා ලැයිස්තුව**

1. පරිගණක සම්බන්ධ සේවා
2. වෙනත් ව්‍යාපාරික සේවා
   a) සම්මන්ත්‍රණ/ නියෝජිත රැස්වීම් ආදිය සඳහා සපයනු ලබන සේවා
3. විදුලි සංදේශන සේවා
4. මූල්‍ය සේවා
   a) රක්ෂණ සේවා
   b) බැංකු සේවා
5. සෞඛ්‍ය සහ සමාජීය සේවා
6. සංචාරක සහ ගමනා ගමන සේවා
7. ප්‍රවාහන සේවා
   a) මුහුදු ප්‍රවාහන සේවා
   b) මුහුදු ප්‍රවාහන උපස්ථායක සේවා



ශ්‍රී ලංකාවෙන් සැපයීමට යෝජිත සීමිත සේවාවන්

දේශිය ක්ෂේත්‍රයක් දියුණු කිරීමේදී විදේශයන්හි ඇති **"**යහපත් දේ**"** අධ්‍යනය කිරීම, උපදේශනය ලබා ගැනිම හා පුහුණුව සඳහා හවුල් කර ගැනීමේ වරදක් නැත. මෙය ද්විපාර්ශ්වික ගිවිසුමකින් **<u>තොරව සිදු කල හැක</u>**: දැනට එලෙස සිදු වෙමින්ද පවති.

එවන් කටයුත්තක් සඳහා දැනට ශ්‍රී ලංකාවට අවතිර්ණ වන ඉන්දියානුවන්, සේවය සැලසිමේදි ශ්‍රී ලංකාවේ **<u>අධිකරණයට යටත්ය.</u>** එමගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වනු ඇත.

නමුත් ඉන්දියාවට අවශ්‍ය වි ඇත්තේ ද්විපාර්ශ්වික ගිවිසුමක් හරහා ඔවුන් ශ්‍රී ලංකාවට එවිමටයි. මන්දයත් ද්විපාර්ශ්වික ගිවිසුමකදි ශ්‍රී ලාංකිකයෙකුට, ශ්‍රී ලාංකික අධිකරණයෙන් ඉන්දියානුවකුට විරුද්ධව පිහිට පැතිය නොහැකි බැවිනි. ද්විපාර්ශ්වික ගිවිසුමකදි ගැටලු මතු වු විට දෙරටේ අධිකරණයට මැදිහත් විය නොහැක. ඒ සඳහා ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. කෙටියෙන් කියතොත් ජාත්‍යන්තර ද්විපාර්ශ්වික ගිවිසුමකින් විවෘත වන ක්ෂේත්‍ර වල ශ්‍රී ලාංකිකයාටත් ඉන්දියානු වැසියාටත් (ඡන්ද බලය හැර) සම අයිතිවාසිකම් හිමි වනු ඇත. බේරුම්කරණය ඉතා සංකීර්ණ, තාක්ෂණික වශයෙන් අපහසු කටයුත්තකි. බේරුම්කරණයේදි බලවත් පාර්ශවයට වාසි සැලසේ. ඉන්දියානු උගුලක අප හිර වනු ඇත. නේපාලයට සිදු වුයේ එයයි.

එබැවින් "ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්" බිහි කිරීම තුළින් හා කරුණු නිසි ලෙස අධ්‍යනය කිරීමත් තුලින් අප රටවැසියන් බේරා ගැනිම අපගේ වගකිමකි. ලොව අන් රටවල් වල එවන් "ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්" ඇත. ඉන්දියාවේද එවන් ජාතික ප්‍රතිපත්තියක් ඇත. අවාසනාවකට අප රටේ, රටවැසියන්ට එවන් අත්‍යවශ්‍ය වු ආරක්ෂාවක් නැත. එබැවින් "ජාතික ප්‍රතිපත්තියකින්" තොරව ද්විපර්ශ්වික වෙළඳ ගිවිසුම් අත්සන් කිරීම මඟින් අවිනිශ්චිත සහ භයානක ඉරණමක් අපට අත් කර දෙනු ඇත.

- ඔබගේ ක්ෂේත්‍රය ඇතුලත් දැයි බලන්න
- ඔබගේ දරුවා නිරත වීමට සිටින ක්ෂේත්‍රය ඇතුලත් දැයි බලන්න

**ඉන්දියාව විසින් සැපයීමට සුදානම් යෝජිත සේවා ලැයිස්තුව**

1. වෘත්තිමය සේවා
   a) ගිණුම්කරණය සහ පොත් තැබීමේ සේවා
   b) වාස්තුවිද්‍යාත්මක සේවා
   c) ඉංජිනේරු සේවා
   d) සංකලිත ඉංජිනේරු සේවා
   e) නගර සැලසුම්කරණය හා භූදර්ශණ ශිල්පීය සේවා
   f) වෛද්‍ය සහ දන්ත වෛද්‍ය සේවා
   g) පශු වෛද්‍ය සේවා
   h) වින්නඹු, හෙද, භෞතික චිකිත්සක හා සම සෞඛ්‍ය සේවා
2. පරිඝණක සම්බන්ධ සේවා
3. පර්යේෂණ සහ සංවර්ධන සේවා
   a) පර්යේෂණ සහ සංවර්ධන සේවා - ස්වාභාවික විද්‍යාව
   b) පර්යේෂණ සහ සංවර්ධන සේවා - සමාජ විද්‍යාව
4. වතු සේවා
5. බදු හා කල් බදු සේවා
6. වෙනත් ව්‍යාපාරික සේවා
   a) කළමනාකරණ උපදේශන සේවාව
   b) තාක්ෂණික පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණ සේවා
   c) මත්ස්‍ය කර්මාන්තයට අදාල අනිකුත් සේවා
   d) උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව (මුහුදු යාත්‍රා, අහස් යාත්‍රා හෝ වෙනත් ප්‍රවාහන උපකරණ නොමැතිව)
   e) ඇසුරුම්කරණ සේවා
   f) ගිවිසුම් ගත සේවා
7. විදුලි සංදේශ නියාමන සේවා
8. ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා
9. ගොඩනැගිලි හා සම්බන්ධිත ඉංජිනේරු සේවා
10. බෙදා හැරීමේ සේවා (ජීවී සතුන් හැර)
   a) මුදල් අය කිරීම් හෝ කොන්ත්‍රාත් පදනම මත කොමිස් ඒජන්ත සේවා
   b) තොග වෙළඳ සේවා
11. අධ්‍යාපන සේවා
12. පාරිසරික සේවා
13. සෞඛ්‍ය සහ සමාජීය සේවා
14. සංචාරක සහ ගමනා ගමන සේවා
15. විනෝදාත්මක, සංස්කෘතික හා ක්‍රීඩා සේවා
16. ප්‍රවාහන සේවා
   a) මුහුදු ප්‍රවාහන සේවා
   b) මුහුදු ප්‍රවාහන උපස්ථායක සේවා

**ඉන්දියාවෙන් ලබා ගැනීමට සුදානම් අසීමිත සේවාවන්**

**මෙහිදී සමස්ථ සේවාවන්ම විවෘත කර ඇති බැවින්, වෘත්තිය, තාක්ෂණික, පුහුණු-ශ්‍රම, නුපුහුණු-ශ්‍රම ඇතුලු සියලු රැකියා විවෘත වනු ඇත.**

**ඉන්දියාව සඳහා ඉහල වෘත්තිය සේවාවන්ගේ සිට විනෝදාත්මක සේවා ඇතුලු සියලුම සේවාවන් විවෘත කර දීමට යෝජිතය**

# I

# ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වල පසුබිම හා කාර්යභාරය

# 1.1 රජයක කාර්යභාරය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන, සෞඛ්‍යය, ප්‍රවාහන ඇතුලු අංශ වල ජාතික ප්‍රතිපත්ති ස්ථිරව එළිදක්වා නොමැත. එබැවින් දේශපාලන පක්ෂ මාරුවත් සමඟ, ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික ක්‍රියාදාමයන්හි ව්‍යුහයත්, ප්‍රතිපත්තිනුත්, ක්‍රියාපටිපාටීනුත් නිරතුරුවම වෙනස් වීමට භාජනය වේ. එය ජාතික සංවර්ධනය කෙරෙහි ඍජුව බලපාන අයහපත් කාරණයකි. “රටක් දේශපාලන වශයෙන් අස්ථිරභාවයකින් යුතු වේ නම් එරට සංවර්ධනයෙන්ද පසු බසින්නේය” යැයි සංවර්ධන විශේෂඥයින් පවසන්නේද මේ හේතුවෙනි. දේශපාලකයින් වෙනස් වුවද රටේ නිවැරදි ගමන් මඟ වෙනස් නොවී නිසියාකාරව පවත්වා ගැනීමට නම් “ජාතික ප්‍රතිපත්ති” යන්න අනිවාර්යයෙන් ස්ථාපිත කල යුතුය. රටට ආදරේ ඇති රජයකින් බලාපොරොත්තු විය හැකි ප්‍රධාන කාර්යභාරය ලෙස පෙන්වා දිය හැකි වන්නේ රටේ සියලු වැදගත් අංශ සඳහා අවශ්‍ය වන්නා වු ප්‍රතිපත්තින් සකස් කිරීමයි.

සංවර්ධිත රටවල් සංවර්ධනය කරා ගමන් කිරීමේදී කලින් කලට පාලක පක්ෂය වෙනස් වුවද ජාතික ක්‍රියාදාමයන්හි මුලික ප්‍රතිපත්තින් සහ ක්‍රියාපටිපටින්, නිරතුරුවම වෙනස් නොවන ලෙස එම රටවල සිදු වන ක්‍රියාදාමයන් සඳහා **ජාතික ප්‍රතිපත්තින්** සකස් කර ගැනුනි. එමගින් එම රට වල සංවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වේ. යහපාලනය යනු එම ක්‍රියාදාමයයි. සංවර්ධනය ඉලක්ක කොට ගනිමින් ගමන් කරන්නා වු “සංවර්ධනය වෙමින් පවත්නා රටක්” වන ශ්‍රී ලංකාවේ පාලක පක්ෂය එනම් රජයේ කාර්යභාරය වනුයේ කලින් කලට පත් වන රජයන්ගේ කැමැත්ත මත රටේ සංවර්ධන කටයුතු අඩාල වෙන ආකාරයෙන් රටේ කටයුතු කඩාකප්පල් කිරීමට නොහැකි වන සේ සියලු ක්ෂේත්‍රයන් සඳහා “ජාතික ප්‍රතිපත්ති” සකස් කිරීමයි.

“ජාතික ප්‍රතිපත්ති” සකස් කර නොගෙන එනම් ප්‍රතිපත්තියකට අනුගත නොවී වෙළඳ ගිවිසුම් වලට එළඹීම භයානක තත්ත්වයක් ලෙස දැක්විය හැකිය. ලංකාවේ පිහිටීම නිසා ආර්ථික වශයෙන් ලංකාව ඩැහැගැනීමට ඉන්දියාව උත්සාහ කරන නිසා එය තවත් භයානකය. එම නිසා වෙළඳ ගිවිසුම් ඇතුලු සියලු ක්ෂේත්‍ර සඳහා “ජාතික ප්‍රතිපත්තියක්” සකස් කිරීම රජයක වගකීමක් බවද පෙන්වා දීමට කැමැත්තෙමු.

## 1.2 උගතුන්ගේ කාර්යභාරය

උගත් විද්වතුන් කරුණු කාරණා අධ්‍යනය කොට රටට සෙතක් සැලසෙන අයුරින් ප්‍රතිපත්ති සම්පාදනයට දායක විය යුතුයි. නිදහස් අධ්‍යාපනය ලද අප, රට ගැන සිතා නිවහල්ව රටට දායක විය යුතුය. "නිදහස් අධ්‍යාපය" ආයෝජනයක් යන ප්‍රකාශය අර්ථාන්විත වන්නේ එවිටයි. උගත්කමින් හීන, ප්‍රතිපත්ති ගරුකව වැඩ කිරීමට පුරුද්දක් නැති, සිය හැසිරීම රට වැසියන්ට ආදර්ශමත් නොවන අයුරින් කටයුතු කරන දේශපාලන සංස්කෘතින්ගෙන් රට බේරා ගැනීමට අප ක්‍රියා කල යුතුයි.

## 1.3 පුරවැසියන්ගේ කාර්යභාරය

මේ භයානක උගුලෙන් අප රට බේරා ගත යුතුය. මේ රටේ පුරවැසියන් ලෙස පක්ෂ, පාට, ජාති, ආගම්, උස්, පහත් භේදයකින් තොරව අප එකා මෙන් එක් විය යුතු කාලය එළඹ ඇත. රට නිදහස් කර ගත්තේ, අප සියලු දෙනා භේදයකින් තොරව එක් වී නැගී සිටි නිසාවෙනි.

**සියලු ශ්‍රී ලාංකිකයනි එක්වෙමු. සතුරා පරදවමු. මගේත්, ඔබේත්, අපේ දරුවන්ගේත් අනාගතය සුරක්ෂිත කරමු. එය අප නොකලහොත් කිරීමට වෙනත් කෙනෙකු නැත. අප සහ අප දරුවන් පාවාදීමට විරුද්ධ වෙමු.**

## 1.4 දේශපාලන පක්ෂ වල කාර්යභාරය

අතීතයේදී ජාතිකවාදී මෙන්ම වාමාංශික දේශපාලන පක්ෂ විදේශ අතපෙවීම් වලට සෘජුව මැදිහත් විය. එහි ආදීනව ගැන මහජනතාව දැනුවත් කලහ. දේශපාලනයේදී පක්ෂ ප්‍රතිපත්ති පසෙක ලා තනිව රට වෙනුවෙන් හඬ නැගිය. උදා :- ප්‍රේමදාස අගමැතිතුමා තම රජයේ ඉන්දු - ලංකා සාම ගිවිසුමට විරුද්ධ විය.

අද දේශපාලනය පක්ෂ මෙන්ම දේශපාලඥයින් මෙම අනතුර අභිමුවෙහි නිද්‍රාශිලීව පසුවේ. ඔවුන් ද සැබෑවටම රටට ආදරය ඇති නම් මෙම අනතුර වටහා ගත යුතුය.

# 1.5 නේපාලයට සිදු වුයේ කුමක්ද?

ඉන්දියාව දකුණු ආසියාව තුල තම බලය විහිදවමින් සිටි. එය ඔවුන්ගේ ප්‍රගමනය සඳහා රටක් වශයෙන් ගත් ප්‍රතිපත්තිමය තිරණයන් බල ගැන්වීමකි. එය ඉන්දියානුවන් තම රටේත්, තම ජනතාවගේත් උන්නතිය සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාදාමයකි.

ඒ සඳහා ඔවුන් විවිධ උපක්‍රම භාවිතා කරයි. අතිතයේදි ඔවුන් යුධ උපක්‍රම භාවිතා කරන ලදි. අද ඔවුන් තවත් ඉදිරියට ගොස් ඇත. ඔවුන්ගේ නවතම උපක්‍රමය ආර්ථික යුද්ධයයි.

නේපාලය අද එම ආර්ථික යුද්ධයේ ප්‍රබල ගොදුරක් වි ඇත. ඉතාම සුක්ෂම ලෙස ඉන්දියනුවන් නේපාලය ආර්ථික වශයෙන් යටත් කරගෙන ඇත. ඒ සඳහා යොදා ගත් සරල උපක්‍රමය ද්විපාර්ශ්වික ආර්ථික ගිවිසුම්ය. මෙම අනතුර එරට උගතුන් සුලු පිරිසක් පෙන්වා දුනි. නමුත් ඉන්දිය රාජ්‍ය ඔත්තු සේවය උපක්‍රමශිලිව ක්‍රියාත්මක විය.

සමහර නේපාල උගතුන්, බුද්ධිමතුන්, මාධ්‍යවේදින්, දේශපාලඥයින් මෙම ආර්ථික ගිවිසුම් ඉතාම ජනප්‍රිය අයුරින් සමාජ ගත කරන ලදි. කොටින්ම නේපාලය සුරපුරක් වන අයුරු මවා පෙන්වන ලදි. එරට ජනතාව ඔවුන්ව විශ්වාස කරන ලදි. මෙම ගිවිසුම් වලට නිහඩව ආශිර්වාද කරන ලදි. අහිංසක බලාපොරොත්තු ගොන්නක් සහිතව අනාගත අපේක්ෂා මුදුන්පත් කර ගැනිමට තම ආත්මයම ජනප්‍රිය වදන් වලට කැප කරන ලදි.

අද නේපාලය අපේක්ෂා භංගත්වයට පත් වු රටකි. සිදු වු ආර්ථික සංවර්ධනයක් නැත. ඉන්දියානු ග්‍රහනයට අසුවි මිදිය නොහැකි ආර්ථික උගුලක සිර වි සිටිති. ඔවුන් විශ්වාසය තැබු උගතුන්, බුද්ධිමතුන්, දේශපාලනඥයින්, මාධ්‍යවේදින් මුදලට වරදාන වරප්‍රසාද තනතුරු වලට ගිජු වි ජනතාව රැවටු බව අද ඔවුන් වටහාගෙන ඇත. සියල්ල සිදු වි හමාරය. කල හැකි දෙයක් ඉතිරිව නැත. සුලුතරයක් ජනතාව රවටා, රට පාවාදි ඇත. නමුත් පිලිසරණක් නැත. පරම්පරා ගණනක් වන්දි ගෙවමින් සිටියි.

අද ලංකාව තුල එයම සිදු වෙමින් පවති. සමහර ආර්ථික විශේෂඥයන්, මාධ්‍යවේදින්, දේශපාලනඥයින් ජනතාව මුලා කරමින් සිටියි. ඉන්දියානු රහස් ඔත්තු සේවය පෙරටත් වඩා ක්‍රියාශිලිව සිටි. රටම ක්‍රමයෙන් ඩැහැගනිමින් සිටි. රටක ගමනක අවසානය ලගා වෙමින් තිබේ. ප්‍රෞඩ ඉතිහාසයක් ඇති නිවහල් රටක් ගැලවිය නොහැකි උගුලක පැටලෙමින් සිටියි. එක්ව නැගිටිමු. ශක්තිමත්ව ඉදිරියට යමු. අපට කල හැකි දේ හෙට නොව අදම කරමු.

## 1.6 ලෝක වෙළඳ සංවිධානයේ නිර්දේශ

ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද වැඩමුළුවක් ලෝක වෙළඳ සංවිධානයේ ජාත්‍යන්තර වෙළඳ සේවා ගිවිසුම් පිළිබඳ අධ්‍යක්ෂක හම්ඩි මොම්දෝහ් මහතාගේ ප්‍රධානත්වයෙන් 2016/06/27, 28 දිනයන්හිදි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදි පැවැත්වුණි. ඒ සඳහා වෘත්තිකයන් රැසක් සහභාගි විය. එහිදි ජාත්‍යන්තර වෙළඳ හා සේවා ගිවිසුම් පිළිබඳව අධ්‍යනය කරන ලදි. ජාත්‍යන්තර සේවා වෙළඳාම් ක්‍රම 4කට සිදු විය හැකිය.

1. වෙනත් රටක සිට සේවා සැපයීම (Cross Boreder Supply)
2. විදේශ රටකට ගොස් තම සේවාව ලබා ගැනීම (Consumption Abroad)
3. සේවා ආයතන ශාඛාවන් තවත් රටක පිහිටුවීම (Commertioal Presence)
4. වෙනත් රටක පුරවැසියන් පැමිණ සේවා සැපයීම (Movement Natural Presons)

ද්වි පාර්ශ්වික ගිවිසුම් මගින් මෙම අංශ තව දුරටත් විවෘත කිරීම සිදු කෙරේ. එහි ප්‍රධාන අංශ 2 කි.

1. වෙළඳ පොළ පිවිසුම (Market Access)
2. පුරවැසියන් සේ සැළකීම (National Treatment)

මෙසේ සේවා වෙළඳපොළ විවෘත වීම විශාල සමාජ පරිවර්තනයන්ට හේතුවන අතර එය රටට වාසිදායක ලෙස කලමනාකරණය කිරීමේදි ජාතික ප්‍රතිපත්තිය හා අවශ්‍යතාවය එතුමා පැහැදිලි කර දෙන ලදි. එහිදි එම නියාමනයට පිහිටුවන ආයතනයට, එහි මුඛ්‍ය පරමාර්ථ ඉටු කර ගැනීමට පහත සඳහන් මූලික ගුණාංග වල අවශ්‍යතාවයද පැහැදිලි කෙරුණි.

1. බලධාරිත්වය (Mandate)
2. ස්වාධීනත්වය (Independency)
3. සමාජ පැතිකඩවල් නියෝජනය (Interface)
    i. රාජ්‍ය (Governmental)
    ii. පෞද්ගලික අංශය (Private Sector)
    iii. බුද්ධි මණ්ඩල (Think Tanks)
    iv. මහජනතාව (Civil Society)
4. වගවීම (Accountability)
5. පාරදෘශ්‍යභාවය (Transparency)
6. සුදුසුකම් ඇති පුද්ගලයන් (Human Resources)

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් මෙවැනි ආයතනයන් සහ ක්‍රියාපටිපාටින් ඇති කරන ලෙස ඉල්ලමින් අත්සන් දසලක්ෂයක් එකතු කිරීමද මේ වන විට සිදු වෙමින් පවති.

**තත්ත්වය මෙසේ තිබියදී ලෝක වෙළඳ සංවිධානයේ නිර්දේශද නොසලකා, ජාතික ප්‍රතිපත්තියකින් හෝ නියාමනයකින් තොරව ETCA ගිවිසුම කඩිනමින් අත්සන් කරන බව අගමැතිතුමා ප්‍රකාශ කරයි. මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි.**

# II

# ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් වල ඉතිහාසය හා වර්තමානය

# 2.1 පුරවැසියා විසින් වෙළඳ ගිවිසුම් පිළිබඳ දැන ගත යුතු කරුණු

යම් පුද්ගලයින් දෙදෙනෙකු හෝ ආයතන 2ක් අතර වෙළඳාම් කල හැක. එහිදි ලාභ හෝ අලාභ සිදු විය හැක. එමෙන්ම රටවල් 2ක් අතර වෙලඳාම් කල හැක. එහිදිද ලාභ හෝ අලාභ සිදුවිය හැක.

වෙළඳාම් කල හැකි දෑ අනුව වෙළඳාම කොටස් 2කට බෙදිය හැක.

1. **භාණ්ඩ වෙළඳාම** - පාරිභෝගික භාණ්ඩ, ඛණිජ තෙල්, ආහාර ද්‍රව්‍ය ආදි දෑ
2. **සේවා වෙළඳාම** - වෛද්‍ය, ගෘහනිර්මාණ වැනි වෘත්තිය සේවා
   මැෂින් ඔපරේටර්, රූපලාවන්‍ය වැනි තාක්ෂණික සේවා

**දෙරටක් අතර වෙළඳාම් කිරීමේදි අංශ කිහිපයක් ගැන සැලකිය යුතුය. එනම්,**

- මෙම රටෙහි නිතියට අනුව භාණ්ඩ හෝ සේවා වෙළඳාම් කල හැකිද යන්න,
- ඒ රටේ බදු පනවන ආකාරය,
- වරාය හා ගුවන් තොටුපල වල තිබෙන ක්‍රමවේදයන්

එපමණක් නොව එම රටේ ප්‍රතිපත්තිවලට, සංස්කෘතියට, සාමාජිය තත්ත්වයට ගැලපෙන අයුරින් එය සිදු විය යුතුය. එබැවින් රටවල් අතර වෙළඳාම් කිරීමේදි මේ කාරණා සම්පූර්ණ කර ගන්නා ක්‍රමවේදයන් ගණනාවක් ඇත.

## ලෝකයේ පවතින වෙළඳ ගිවිසුම් වර්ග:

### 1. ඒකපාර්ශ්වික වෙළඳ ගිවිසුම්

ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය (BOI ආයතනය) විදේශ ආයෝජන ගෙන ඒමේදි ඉහත කාරණා වලින් සිදු විය හැකි බාධා අඩු හෝ නැති කර ගනිමින් වෙළඳාම් කිරීමට පහසුකම් සලසයි. එවිට ඉන්දියානුවෙක් හෝ ඉන්දියානු සමාගමක් ලංකාවේ ව්‍යාපාර වල යෙදිය හැක. නමුත් ලංකාවේ නිති පද්ධතියට යටත්ව ඔවුන් කටයුතු කල යුතුය. ශ්‍රී ලාංකිය පුරවැසියෙකුට එම වෙළඳාමෙන් අවැඩක් සිදු වේ නම් <u>ලංකා අධිකරණය මගින් පිහිට ලබා ගැනිමට ශ්‍රී ලාංකියකුට ඇති අවකාශය ඉන් අහෝසි වී නැත</u>.

## 2. ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම්

රටවල් දෙකක බලවතුන් එකඟවන කාරණා හමුවේ නිදහසේ ඉන්දියානුවෙකුට ශ්‍රී ලංකාවේත්, ශ්‍රී ලාංකිකයකුට ඉන්දියාවේත් වෙළඳාම් කිරීමට ඉඩ සැලසේ. එහිදී එක් රටක අධිකරණයට තනි තීරණ ගත නොහැක. අදාල ගිවිසුමෙන් එකඟවන්නා වූ පරිදි ඒ රටවල් 2කම එකඟ වන <u>බේරුම්කරණයකට මිස තනි රටක අධිකරණයක පිහිට පැතිමට පුරවැසියකුට ඇති හැකියාව අහෝසි වනු ඇත.</u>

### ලෝක වෙළඳ සංවිධානය (WTO)

ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකත්වය දරණ රටවල් 162 අතරින් එක් රටකි. එබැවින් ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සඳහා ඇතුල් වීමේදී ලෝක වෙළඳ සංවිධානයේ නිර්දේශක මාර්ගෝපදේශනයන් හට යටත් විය යුතුය. පෙර පරිච්ඡේදයේ ලෝක වෙළඳ සංවිධානයේ නිර්දේශයන් පිළිබඳ වැඩි දුර සාකච්ඡා කරන ලදි. සේවා වෙළඳාම භාණ්ඩ වෙළඳාමට වඩා සංකීර්ණය. එය පෙර විස්තර කල පරිදි ක්‍රම 4 කට සිදු වේ.

ඒක පාර්ශවික හෝ ද්වි පාර්ශ්විකව සිදු විය හැකි අතර ද්විපාර්ශ්වික ගිවිසුමකදී රටේ අධිකරණ පද්ධතිය අභිබවා යයි.

1. වෙනත් රටක සිට සේවා සැපයීම (Cross Boreder Supply)
   උදා: පිටරටක සිට වෛද්‍ය වාර්තා සැපයීම (X-ray, Lab Reports)
   ඉන්දියාවේ සිට නීති උපදෙස් සැපයීම
   ඉන්දියාවේ සිට වාස්තු විද්‍යාත්මක සැකසුම් කිරීම
   ඉන්දියාවේ සිට රූපවාහිනි සංස්කරණයන් සිදු කිරීම

2. සේවා ලාභියා විදේශ රටකට ගොස් තම සේවාව ලබා ගැනීම (Consumption Abroad)
   උදා: රෝගියකු සිංගප්පූරුවට යවා ශල්‍යකර්මයන් සිදු කිරීම
   ඇඳුමක් මසා ගැනීමට ඉන්දියාවට යෑම

3. අයිතිය හිමි රටේ සේවා ආයතන තම ශාඛාවන් තවත් රටක පිහිටුවීම (Commertioal Presence)
   උදා: ඉන්දියාවේ රෝහල් පද්ධතියක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම
   ශ්‍රී ලංකාවේ ගෘහභාණ්ඩ අලෙවිසැලක් ඉන්දියාවේ පිහිටා තිබීම

4. වෙනත් රටක පුරවැසියන් පැමිණ සේවා සැපයීම (Movement Natural Presons)
   උදා: ඉන්දිය වෛද්‍යවරු ශ්‍රී ලංකාවේ පෞද්ගලික රෝහල් වල සේවය කිරීම
   ශ්‍රී ලාංකික ගණකාධිකාරිවරු ඩුබායිහි සේවය කිරීම


# 2.2 ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාම් ඉතිහාසය

ශ්‍රී ලංකාව දැනටමත් කලාපීය රටවල් සමඟ ද්වි පාර්ශ්වික වෙළඳ ගිවිසුම් කිහිපයක් සඳහා ඇතුලත් වි ඇත. එමෙන්ම පවතින රජයන් විවිධ රටවල් සමඟ වෙළඳ ගිවිසුම් සඳහා අවතිර්ණය වීමට දැඩි ඇල්මක් දක්වයි.

### ශ්‍රී ලංකාව දැනට සම්බන්ධ වි ඇති ගිවිසුම්

1. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
2. ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)
3. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISLFTA)
4. පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
5. SAARC Agreement on Trading Services (SATIS)
6. The Generalized System of Preferences (GSP)
7. SAARC Preferential Trade Agreement (SAPTA)

### ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුම් විකාශනය



# 2.3 ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් වල වර්තමාන තත්වය

### 01 ප්‍රතිපත්තිමය තීරණ වෙනුවට දේශපාලඥයින් තීරණ ගැනීම

රටක් වශයෙන් දියුණු වීමට නම් සියලුම ජාතික කටයුතු සඳහා ප්‍රතිපත්තීන් තිබිය යුතු අතර ඒ ප්‍රතිපත්ති මත පදනම්ව තීරණ ගැනීම සිදු කල යුතුය. වර්තාමනයේ සංවර්ධිත යැයි හඳුන්වන සියලුම රාජ්‍යයන් සංවර්ධිත බව ලඟා කරගෙන තිබෙනුයේ ප්‍රතිපත්තීන් මත කටයුතු කල නිසාවෙනි. සංවර්ධනය අපේක්ෂා කරන රටක් වශයෙන් අප රටේ ජාතිකමය තීරණ ගන්නා පුද්ගලයින් කල යුතු වන්නේ ජාතික ප්‍රතිපත්ති සකස් කොට ඒ මත පදනම්ව රට සංවර්ධනය කරා ගෙන යාමයි. නමුත් සිදු වනුයේ රාජ්‍ය තන්ත්‍රය මෙහෙය වන බලධාරීන් තම පක්ෂ දේශපාලන මතය ඉදිරියට ගෙන යාම සඳහා රටේ සුභසිද්ධිය නොතකා තම පක්ෂ මානසිකත්වයෙන් යුතුව තීරණ ගැනීමයි. එමගින් අපේක්ෂිත සංවර්ධිත තත්ත්වයට ලගා වීමට නොහැකිවනවා පමණක් නොව වැරදි තීරණ වල ප්‍රතිඵලයන් වශයෙන් වර්තමානයේ අත් කරගෙන ඇති සංවර්ධිත මට්ටමෙන්ද පහළට ගමන් කරනු ඇත. සිදුවිය යුත්තේ දේශපාලඥයින්ගේ මතයෙන් මිදී රටේ සුභසිද්ධිය තකා ජාතික ප්‍රතිපත්තීන් සකස් කොට ඒ මත පදනම්ව කටයුතු කිරීමයි.

### 02 පුරවැසියා වික්ෂිප්ත වන ජාත්‍යන්තර උපාය මාර්ග

රජයේ පදනම් විරහිත පරස් පර විරෝධි ප්‍රකාශ මෙම වික්ෂිප්තභාවය ඇති වීමට හේතුවයි. වෙළඳ ගිවිසුම්, ඒවා ක්‍රියාත්මක කරන ආකාරය සහ ඒවායේ වගකීම ආදි කරුණු පිළිබඳව පදනම් විරහිත ප්‍රකාශ සිදු කරන අතර ඒවා දිනෙන් දින පමණක් නොව එකම කතාවේ මුලදී සහ අගදීද වෙනස් කිරීම පුරවැසියා තුල එම ප්‍රකාශ පිළිබඳ වික්ෂිප්තභාවය තව දුරටත් වැඩි කරනු ලබයි. එමගින් සමහර දේශපාලන අරමුණු ඉටු කර ගැනීම ජාත්‍යන්තර උපාය මාර්ගයක් බව කවුරුත් දනී.

### 03 ක්‍රියාවලියේ විනිවිධභාවයක් හා ස්ථාවරභාවයක් නොමැතිවීම

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වලට එළඹීම රටක ඉතා තීරණාත්මක ක්‍රියාවක් බව කවුරුත් දනී. එනමුත් එම ගිවිසුම් පිළිබඳ පුරවැසියන්, විශේෂයෙන්ම විද්වතුන්, වෘත්තිකයින්, මධ්‍යවේදින් පමණක් නොව දේශපාලඥයින් පවා දැනුවත් නොකිරීම වර්තමානයේ උද්ගත වී ඇති ප්‍රධාන ගැටලුවකි.

### 04. නුසුදුසු අය ගිවිසුම් සකස් කිරීම

පැවතුන පාලන පක්ෂයන් දිගින් දිගටම වෙනස් වුවද වෙළඳ ගිවිසුම් සකස් කිරීමට උපදේශනය කරනු ලබන ආර්ථික විශේෂඥයින් යැයි කියා ගන්නා පුද්ගලයන් තිදෙනෙක් සහ අනිකුත් පිරිස නොවෙනස්ව උපදේශණය කරනු ලබයි.

ඔවුන් එම කාර්යයට කිසිසේත් සුදුසු නැති පුද්ගයින්ය. ඔවුන් ස්වාධීනත්වයකින් තොරව, වෙනත් පාර්ශව මත යැපෙමින්, ආනයන ආදි වු ව්‍යාපරයන්ට වක්‍රව හෝ සෘජුව සම්බන්ධකම් ඇති පිරිස්ය. එය ආචාරධර්ම වලට පටහැනි වනවා පමණක් නොව රටට විශාල හානියක් සිදු කරන්නක්ද වෙයි.

## 05 සිදුවන පාඩුවට වගකීමක් දරන්නෙක් නොමැතිවීම

මෙම ගිවිසුම් වලට දිගින් දිගටම නොවෙනස්ව උපදේශනය කරනු ලබන පිරිස්, ඔවුන් ගත් වැරදි තීරණ මත සිදු වන අවාසියට වගකීම නොදරයි. අවාසනාවන්ත කාරණය වනුයේ මෙම ගිවිසුම් වල පාඩු දරනුයේ අප හා අනාගත පරපුරයි. මෙම ගිවිසුම් උපදේශනය කල පිරිසත්, මේවා අත්සන් කළ රජයන් සහ නායකයනුත් කිසිදු වගකීමක් නොදරණවා පමණක් නොව අවාසිය පුරවැසියා මත පටවා තම සුබවිහරණය පමණක් අපේක්ෂා කරයි.

## 06 උපදේශනය කරන පිරිස් දේශපාලඥයන්ව නොමඟ යවමින් කටයුතු කිරීම

“වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්” නොමැති නිසා ගිවිසුම් සකස් කරන පුද්ගලයන් රට පාලනය කරන දේශපාලඥයින් රවටමින් ඔවුන්ට හා වෙනත් විදේශ බලවේග වලට අවශ්‍යය අරමුණු ඉටු කර ගැනීම සඳහා ගිවිසුම් සකස් කිරීමේ කටයුතු සිදු කරන බව දැකිය හැකිය. මොවුන් දේශපාලනඥයින්ට හා රජයේ අමාත්‍යංශ වලට උපදේශනද සලසයි. මොවුන් දක්ෂ අයුරින් දේශපාලඥනයින් ඔවුන්ගේ මතයට ග්‍රහනය කරගෙන ඇත. අවසානයේ සිදුවන අසාර්ථකත්වය හමුවේ මහජන අප්‍රසාදයට ලක් වනුයේ දේශපාලනඥයින් බවද කිව යුතුය.

## 07 පවතින ගිවිසුම් විවරණයකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක වීම

වෙළඳාමක් කිරීමේදි දිනපතා හෝ මාසිකව හෝ අවම වශයෙන් වාර්ෂිකව විවරණය කරයි. නමුත් ඉන්දු - ලංකා වෙළඳ ගිවිසුම නිසි විවරණයකින් තොරව වසර 16ක් තිස්සේ පවත්වාගෙන යනු ලබයි. 2003 දි සිදු කල එකම විවරණයේදි හඳුනාගත් නිර්දේශ වලට කිසිදු පියවරක් ගෙන නොමැත. එය රට පාවා දීමකි.

## 08 ඉන්දිය ශ්‍රමිකයන් ආනයනය කිරීමට උත්සාහ කිරීම

සංවර්ධිත බවක් අත්පත් කර ගැනීමට නම් රටක ශ්‍රම බලකාය ගැන විශේෂ අවධානයක් යොමු කල යුතුය. ශ්‍රම බලකායේ දැනට ඇති අඩුපාඩුකම් හඳුනාගෙන නඟා සිටුවිය යුතුය. අප රටේ ශ්‍රමය පුහුණු ශ්‍රමයක් බවට පත් කොට කාර්යක්ෂම කර රටේ සංවර්ධනයට යොදා ගත යුතුය. නමුත් දැන් සිදු වනුයේ ලාංකිය ශ්‍රම බලකාය දුර්වල යැයි කියා එයට පිළියමක් ලෙස ඉන්දිය ශ්‍රමිකයන් ආනයන කිරීමට කටයුතු කිරීමයි. එය රටට ආදරය කරන නායකයෙක් නොකරන දෙයකි. ඉන්දියාවෙන් පැමිණෙන ශ්‍රමිකයන්ගේ ගුණාත්මකභාවය තහවුරු කරන ක්‍රමවේදයක්ද ලංකාවේ නොමැත. මෙය අනුවණකමක් ලෙස දැකිය හැකිය.

### 09 දුර දිග නොබලා පටු වාසි අරමුණු කරගෙන කටයුතු කිරීම

වෙනත් රාජ්‍යයක් සමගින් වෙළඳ ගිවිසුමක් හෝ වෙනත් කටයුත්තක් සඳහා හෝ හවුලේ කටයුතු කරයි නම් ඒ පිළිබඳව අධ්‍යනය කල යුතු බොහෝ කරුණු තිබේ. රටේ පවතින ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන ආදි වූ තත්ත්වයන් පිළිබඳවද සිතා බලා එම තීරණයන් ගත යුතුය. නමුත් සිදු වනුයේ තම තමන්ගේ පටු වාසි අරමුණු කරගෙන ක්‍රියා කිරීමයි.

### 10 රටට හිතැති පිරිස් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම

රටට ආදරේ ඇති පිරිස් මේ සිදු වන ක්‍රියාවලිය ගැන සංවේදි නොවි සිටිම හා අධ්‍යනය නොකිරීම කනගාටුවට කරුණකි. විද්වතුන් හා විද්වත් ආයතන නිහඬ පිළිවෙතින් මිදිය යුතුය.

### 11 පුරවැසි අදහස් වලට රජය බලපෑම් කිරීම

රටට හිතැති යමෙක් මෙම ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් හරහා යම් කිසි විපතක් සිදු වේ යැයි පැහැදිලි කොට ගෙන තම මතය ප්‍රකාශ කලහොත් එවැනි පුද්ගලයන්ට අමානුෂික ලෙස බැන වදිමින්, තර්ජනය කිරීම් ආදිය සිදු කරනු දැකිය හැකිය. නමුත් සිදු විය යුත්තේ සියලු දෙනාගේ අදහස් වලට ගරු කරමින් රටට වැඩදායි යෝජනා පිළිගෙන වෙළඳ ගිවිසුම් සාර්ථක කර ගැනිමට උපයෝගි කර ගැනිමයි.

## 2.4 ජාත්‍යන්තර ද්විපාර්ශ්වික ගිවිසුමකට යොමුවිමට පෙර අධ්‍යනය කල යුතු කරුණු.

### ශ්‍රී ලංකාව ඉන්දියාවට මෙතරම් වැදගත් ඇයි?

ශ්‍රී ලංකාවට ඉන්දියන් සාගරයේ සුවිශේෂී භූගෝලීය පිහිටුමක් ඇත. ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාව බටහිර හා නැගෙනහිර යා කල, සේද මාවතේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය විය. එබැවින් බටහිර මෙන්ම නැගෙනහිර රටවල සුවිශේෂ අවධානයක් ශ්‍රී ලංකාවට සෑම කාල වකවානුවකම යොමු විය. ඉන්දියාව, දකුණු ආසියා කලාපයේ ප්‍රධාන බලවතා ලෙස තම බලය පතුරවමින් සිටි. අප රට ගෝලිය වශයෙන් ඉතාමත් වැදගත්කමකින් යුතු ස්ථානයක පවතින නිසා අප රට කෙරෙහි ඉන්දියාව අතීතයේ පටන්ම විශේෂ අවධානයක් යොමු කරයි. ඉන්දිය ආක්‍රමණ ගැන අම්හිරි ඉතිහාසයක් ශ්‍රී ලංකාවට ඇත.

## තිස් වසරක කුරිරු යුද්ධයක අත් දැකීම

අප රට අවුරුදු තිස් ගණනක යුද්ධයකින් පසු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් සිටි. එය වැලැක්වීමට පෙර දරන සතුරන් හඳුනා ගැනීමට අප බුද්ධිමත් නොවුනහොත් නැවතත් අප හට භයානක ඉරණමක් අත්වනු ඇත.
ඈත අතීතයේ බලවත් රටවල් අනිකුත් රටවල් යටපත් කර ගැනීමට අවි බලය යොදා ගන්නා ලදි. උතුරු නැගෙනහිර ඇති කල යුද්ධයද එවැනි කූට උපක්‍රමයකි. එමගින් ඇති වූ හානිය පරම්පරා ගණනාවකට උරුම විය. තවමත් අපි එම පව ගෙවමින් සිටිමු.

## ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළඳාම ආක්‍රමණය

ශ්‍රී ලංකාවද ඉන්දියාව සමග 1998 ද්විපාර්ශ්වික භාණ්ඩ වෙළඳ ගිවිසුමකට ඇතුලත් විය. එම ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට වූ ආර්ථික පාඩුව ඉතාම අධිකය. එමෙන්ම එමගින් සෙතක් වූ එකම ව්‍යාපාරයක්වත් ශ්‍රී ලංකාව තුල නැත. එමගින් ඉන්දියාව අධික වාසි ලබමින් සිටි. මෙම ගිවිසුම අත්සන් කල දේශපාලකයින් අද නැත. ගිවිසුම සකස් කල විද්වතුන් විවිධ වරදාන හා මුදල් ලබමින් අදටත් යහතින් සිටි. වගකිව යුත්තෙක් නැත. එහෙත් අපි, පරම්පරා ගණනක් තිස්සේ වන්දි ගෙවමින් සිටින්නෙමු.

## රැකියා වෙළඳ පොල ආක්‍රමණය කිරීමේ කුමන්ත්‍රණය

එම ගිවිසුම කෙටුම්පත් කල විද්වතුන් යැයි කියා ගන්නා පිරිස අද අපගේ සේවා (රැකියා) වෙළඳපොලද ඉන්දියාවට පූජා කිරීමට අර අඳිමින් සිටිති. දේශපාලකයින්ව නොමග යවමින් සිටි. අප පමණක් නොව අපේ රටේ අනාගතයම ඉන්දියාවට විකිණීමට සියලු කාරණා සම්පූර්ණ කර අවසන්ය.

## ගිවිසුමට පෙර සුරක්ෂිතතාව තහවුරු කරන ජාතික ප්‍රතිපත්තියක වැදගත්කම

අනෙක් රටවල, තම පුරවැසියන් ආරක්ෂා කරගනිමින් වෙළඳ ගිවිසුම් සකස් කිරීමට “වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්” අනුගමනය කරනු ලැබේ. දියුණු රටවල පමණක් නොව අප්‍රිකානු රටවලද වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇත. ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් නැත. මෙවන් ගිවිසුම් අසාර්ථක වූ විට එයට වගකියන ක්‍රමවේදයක් නැත. ද්විපාර්ශ්වික ගිවිසුම් නිසා ඒවා නැවත අවලංගු කිරීමද කල නොහැක.
ද්විපාර්ශ්වික ගිවිසුම් වලින් අවැඩක් අපට සිදු වන විට ඊට පිහිටවීමට ශ්‍රී ලංකා අධිකරණයට බලයක් නැත. ඒ සඳහා ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය මිල අධික, තාක්ෂණිකව සහ නීතිමය වශයෙන් අපහසු බලවත් පාර්ශවයට වාසි සහගතව නිරන්තරව ක්‍රියාත්මක වන ක්‍රමවේදයකි. ඉන්දියාව ඉදිරියේ අපව අසරණ කිරීමකි. අප, රටක් ලෙස අවාසනාවන්ත ඉරණමකට මුහුණ දෙමින් සිටියි.

ද්විපාර්ශ්වික ගිවිසුමක් ඇති කර ගත යුත්තේ ජාතික ප්‍රතිපත්තියක් හෝ නීතියට අනුවය. නැතහොත් සිදු වන්නේ බලවත් සහ කේවල් කිරීමේ හැකියාව වැඩි පාර්ශවයට වාසි සහගත ලෙස ගිවිසුම් නිර්මාණය වීම බව ගිවිසුම් නීතියේදිද පිළිගත් සිද්ධාන්තයකි.

# 25 මහජනයා නොමග යැවීමට කියන කරුණු හා ඒවාට පිළිතුරු

## 1. “ගිවිසුම් වැඩිපුර අත්සන් කිරීමෙන් ආර්ථිකය දියුණු වේ”

ගිවිසුම් වැඩි ප්‍රමාණයක් අත්සන් කල නේපාලය අද ආර්ථික උගුලක සිරවී ඇත. වැදගත් වන්නේ ජාතික ප්‍රතිපත්තිය හා දැක්ම මිස අත්සන් කරන ගිවිසුම් ගණන නොවේ.

## 2. “ඉක්මනින් අත්සන් නොකලහොත් අවස්ථාව ගිලිහී යා හැකියි”

ඉක්මන් කොට බව අපේ පැරණි කියමනකි. අප ගිවිසුම් අත්සන් කල යුත්තේ මනා අධ්‍යනයකින් පසුව අපේ ප්‍රතිපත්තින්ට අනුකූලවය. අවසානයේදි අත්සන් කරන ගිවිසුමෙන් රටට හානියක් නොවී වාසියක් සැලසිය යුතුය.

## 3. “මෙයට විරුද්ධ වන්නේ ලිං මැඩියන් යැයි කීම”

මෙරට විද්වතුන් ලිං මැඩියන් නොවේ, ඔවුන් ජාත්‍යන්තර ඇගයීමකට ලක් වූ අයයි. ඔවුන් නිරතුරුවම තම දැනුම හා කුසලතා ජාත්‍යන්තර මට්ටමට වැඩි දියුණු කරගනු ලබයි. උදා :- ශ්‍රී ලංකාවේ සෑම විශේෂඥ වෛද්‍යවරයකුම වසර දෙකක විදේශ පුහුණුවක් ලබා ඇත.

## 4. “අපි ප්‍රතිපත්තියක් සකසන්නයි කියන්නේ ETCA ගිවිසුම ප්‍රමාද කිරීමට”

ප්‍රමාද වී හෝ නිවැරදි දෙය කිරීම, කලබලයේ අනර්ථයක් කිරීමට වඩා වාසි දායකය. ජාතික ප්‍රතිපත්තියක් සෑදීමේදි දිනන්නේ රටයි.

## 5. “ඉන්දියානු සේවා මෙහි පැමිණෙන විට තරඟකාරීත්වයක් ඇති වී ශ්‍රී ලංකාවේ සේවා වලද ගුණාත්මකභාවය වැඩි වන බව පැවසීම”

ඉන්දියානු සේවා මෙහි පැමිණීමට අධිකරණය අභිබවා ගිය ගිවිසුම් අවශ්‍ය නැත. අදටත් ඉන්දියානු සමාගම් මෙහි ව්‍යාපාර කරයි. අවශ්‍ය සේවා වල ඉන්දියානු ශ්‍රමිකයින්, වෘත්තියවේදින් රැකියා කරයි.

උදා : India Oil සමාගම

## 6. “විද්වතුන් ශ්‍රී ලංකාවට ගෙනෙනවාට ශ්‍රී ලංකාවේ වෘත්තියවේදින් විරුද්ධ බව”

විද්වතුන් ශ්‍රී ලංකාවට ගෙන ඒමට පෙර එම විද්වතුන් සැබෑ විද්වතුන්ද යැයි සෙවීමට ක්‍රමවේදයක් තිබිය යුතුය. එසේ නැතිවුවහොත් විද්වත් වේශයෙන් සොරුන්ද පැමිණේ. ප්‍රතිපත්තියක අවශ්‍යතාවය එයයි. ලොව අන් සෑම රටකම සිදු වන ක්‍රම වේදය මෙයයි.

# III

# ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ක්‍රමවේදය

# 3.1 වෙළඳ ගිවිසුම් ඇති කර ගත යුතු නිවැරදි ක්‍රමය

කවර රටක් සමඟ හෝ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනිමට ප්‍රථමව වෙළඳ ගිවිසුම් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතුය.

වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය බිහිකිරීම සඳහා,

1. නිවැරදි ක්‍රමවේදයක් භාවිතා කල යුතුය.
2. "වෙළඳ ගිවිසුම් ජාතික ප්‍රතිපත්තිය" සැකසීමට බලය පැවරූ සකසන කොමිෂමක් බිහිකල යුතුය.

එලෙස බිහිකරන ජාතික ප්‍රතිපත්තියට අනුව වෙළඳ ගිවිසුම් නිර්මාණය කර අනුමැතිය සඳහා කැබිනට් මණ්ඩලයටත් ඉන් පසු පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කල යුතුය. පාර්ලිමේන්තුව මෙහිදි අවසන් තීරකයා බවට පත් වේ.

නමුත් ගිවිසුම් සකස් කිරීම පාර්ලිමේන්තුවට සිදු කල නොහැක. තවද,

- අත්තනෝමතිකව,
- ජාතික ප්‍රතිපත්තියකට අනුගත නොවී,
- ගිවිසුමේ ප්‍රතිපල වලට වගකීම දැරීමකින් තොරව

අද බිහිවෙමින් තිබෙන ඉන්දු - ලංකා ගිවිසුම පාර්ලිමේන්තුවට යොමු කිරීම කිසිම ආකාරයකින් නිවැරදි නොවේ.

ප්‍රතිපත්ති ගරුක කටයුතු වලදී,

- නිවැරදි ක්‍රමවේදයක් තිබිය යුතු බවත්,
- වගකීම් දරණ අධිකාරියක් තිබිය යුතු බවත් පහත නිදසුන් මගින් ඔබට පැහැදිලි කරමු.

### නිදසුන 01

ශ්‍රී ලංකාවේ පාසල් වල 1 ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුලත් කර ගන්නා නියමිත ක්‍රියාපටිපාටියක් නොමැති යුගයේ දරුවන් ඇතුල් කිරීමට පදනමක් තිබුණේ නැත. නමුත් අද නියමිත ක්‍රියා පටිපාටියක් ඇත. එය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු ආයතනයක්ද ඇත. මේ නිසා කවර රජයක් මාරු වුවද 1 ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුලත් කරගැනිම එකම ක්‍රියාපටිපාටියට අනුව සිදු වේ. එම ප්‍රතිපත්ති වෙනස් කිරීමටද නිර්දේශිත ක්‍රමවේදයක් ඇත. යම් අයෙකුට ක්‍රමවේදයක් තුලින් සාධාරණය

ඉටු නොවු බව සිතන්නේ නම් ඔහුට අදාල වගකිම් දරණ අධිකාරියට විරුද්ධව පැමිණිලි කල දැක. අධිකරණයට පවා පැමැණිලි කර සාධරිණයක් ඉටු කර ගත හැක.

### නිදසුන 02

සේවකයන්ගේ වැටුප් අත්තනෝමතිකව නිර්ණය වු යුගයේ නිරතුරු වැටුප් අරගයා වෘත්තිය ක්‍රියා මාර්ග ගැනුනි. නමුත් ජාතික වැටුප් ප්‍රතිපත්තියක් බිහි කිරීම වැදගත් බව අප සංගමය එවකට හිටි ජනාධිපතිතුමියට පැවසුවෙමු. පළමුව සිදු වුයේ “ජාතික වැටුප් ප්‍රතිපත්තිය” බිහි කිරීම සඳහා “වැටුප් කොමිෂන් සභාව” එළි දැක්විමයි. වැටුප් කොමිසමට ගැසට් මගින් ජාතික වැටුප් ප්‍රතිපත්තිය බිහි කිරීමේ බලතල ලබා දි තිබුණි. එලෙස බිහිවු වැටුප් කොමිසමේ වැටුප් ප්‍රතිපත්තිය කැබිනට් මණ්ඩලයේ හා පාර්ලිමේන්තුවේ අනුමැතියට යොමු වේ. පාර්ලිමේන්තුව සිදු කරනුයේ වැටුප් කොමිසම මගින් සකස් කල ප්‍රතිපත්තිය අනුමත කිරීමයි.

නමුත් වෛළද ගිවිසුම් සඳහා ශ්‍රී ලංකාව තුල ජාතික ප්‍රතිපත්තියක්ද ඒ සඳහා වගකීම් දරණ අධිකාරියක්ද නොමැත. එම නිසා පවතින්නේ නිල නොවන සාකච්ජා පමණි.

| | නියමිත ක්‍රියාපටිපාටියක් | වගකිවයුතු අධිකාරියක් |
|---|---|---|
| ජාතික වැටුප් ප්‍රතිපත්තිය | ඇත | ඇත |
| දුම්රිය ගමනාගමන කාලසටහන | ඇත | ඇත |
| නමුත්, | | |
| වෙළඳ ගිවිසුම් | නැත | නැත |

වගුව : නියමිත ක්‍රියාපටිපාටීන් සහ වගකිවයුතු අධිකාරීන්

# 3.2 වෙළඳ ගිවිසුම් ඇති කරගත යුතු නියමිත ක්‍රියාපටිපාටිය

ජාත්‍යන්තරයත් සමඟ වෙළඳ ගිවිසුම් හෝ වෙනත් ගිවිසුම් අත්සන් කිරීමට මත්තෙන් පිළිපැදිය යුතු නිවැරදි ක්‍රමවේදය පහත ලෙස පියවර 5 කින් අප එළි දක්වමු.

| | |
|---|---|
| **පළමුව** | **දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර රටට වාසි වන මගකට යොමු කිරීම.** |
| **දෙවනුව** | **ජාතික වශයෙන් වැදගත් අංග සුරක්ෂිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කල යුතුය.** |
| **තෙවනුව** | **වෙළඳාම විවෘත වන ක්ෂේත්‍ර වල ආරක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.** |
| **සිව්වනුව** | **වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂිත අරමුණු නිර්වචනයකර එළි දැක්වීම.** |
| **පස්වනුව** | **ක්‍රමවේදය තුල පිලිපැදිය යුතු මූලධර්ම ස්ථාපනය කිරීම.** |

පළමුව

## දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර රටට වාසි වන මගකට යොමු කිරීම

සාමාන්‍යයයෙන් විදේශයන් සමඟ වෙළඳ ගිවිසුම් වලට එළඹීමේදි නිසි අධ්‍යනයක් සිදු කල යුතු බව අප කවුරුත් දන්නා කරුණකි. බුද්ධිමත්, උගත්, ස්වාධීන, ආර්ථික විද්‍යාව නම් වු විෂය ක්ෂේත්‍රය පිළිබඳ නිසි දැනුමැති, ප්‍රායෝගිකව එම දැනුම ක්‍රියාත්මක කර ගැනිමට හැකියාවත් ඇති රටට හිතෛෂි, වගකීම් දැරීමට හැකි පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින්, අන්තර්ජාතික වෙළඳ ගිවිසුම් පිළිබඳව මනා අධ්‍යනයක් සිදු කල යුතුය. නිසි අධ්‍යනයකදි, වෙළඳ ගිවිසුමට විවෘත වන ක්ෂේත්‍ර, වෙළඳාම සිදු කරන වෙළඳ භාණ්ඩ හෝ සේවා, වෙළඳ ගිවිසුමට අදාල කාල රාමුව ආදි දෑ පිළිබඳවද අවධානය යොමු කල යුතුය. එය රටේ වගකිව යුතු නිළධාරීන් සහ විද්වතුන් විසින් සිදු කල යුතු ඉතා වැදගත් වු කාර්යයකි.

ලොව දියුණු යැයි පවතින බලවත් රටවල් පවා අන්තර්ජාතික ගිවිසුමකට පෙර නිසි අධ්‍යනයන් සිදු කරයි. උදාහරණයක් ලෙස මෑතකදි නවසිලන්තය අත්සන් කල ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම අත්සන් කිරීමට පෙර එම රටේ විද්වතුන්, වෘත්තිකයින් හා අනිකුත් පාර්ශවයන් එම රජය සමඟ වසර 7 1/2 ක් පුරා එම ගිවිසුම පිළිබඳ අධ්‍යනයක් කරන ලදි.

පුද්ගලික අංශයන්හිදි වුවද වෙළඳ ගිවිසුම් වලට එළඹීමේදි නිසි පුද්ගලයන් යොදා ගනිමින් නිසි අධ්‍යයනයකට පසුව ගිවිසුම් සකස් කරනු ලබයි. නමුත් ජාතික වශයෙන් සිදු කිරීමට යන්නා වු මෙම ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්, නිසි පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් මනා අධ්‍යනයකින් තොරව සිදු කිරීම කනගාටුවට කරුණකි.

ශ්‍රී ලංකාව විදේශයන් සමඟ වෙළඳ ගිවිසුම් වලට එළඹීමට මත්තෙන් ඒ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ඇති කර ගැනීම අනිවාර්යය. එවැනි ප්‍රතිපත්ති රාමුවක් තුල හිඳිමින් ජාත්‍යන්තර වෙළඳාම් වලට යොමු වීමේදි වුවද මනා පූර්ව අධ්‍යනයකින් තොරව වෙළඳ ගිවිසුම් වලට එළඹීම සිදු නොකල යුතුය. එවැනි පූර්ව අධ්‍යනයක් පහත කරුණු මත පදනම් විය යුතුය.

1. ගෝලිය වෙළඳ ගිවිසුම්
2. ශ්‍රී ලංකාව තුල දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම්
3. එළඹීමට යෝජිත වෙළඳ ගිවිසුම්


ලොව අන් රටවලද පිලිපදිනුයේ මෙම ක්‍රමවේදයයි.

## වර්තමාන වෙළඳ ගිවිසුම් නිසා ශ්‍රී ලංකාවට ඇති වී ඇති අවාසි ආකාර දෙකකි.


I. ආර්ථිකමය අවාසි
II. අනිකුත් අවාසි

### I. ආර්ථිකමය අවාසි

*ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ආනයන හා අපනයන*




උදාහරණයක් ලෙස 1998දී අත්සන් කෙරුණු 2000දී ක්‍රියාත්මක වූ ඉන්දු - ලංකා භාණ්ඩ ගිවිසුම සැලකීමේදී ශ්‍රී ලංකාවට ඇති වී ඇති අවාසි සහගත තත්ත්වය පහත ප්‍රස්ථාරය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එහිදී ශ්‍රී ලංකාවට අවාසියක් සිදු වනවා පමණක් නොව සිදු වන අවාසියද ක්‍රමක්‍රමයෙන් වැඩි වේ.



එසේම ශ්‍රී ලංකාවේ සම්පූර්ණ අපනයනය සැලකීමේදි ඉන්දියාවට සිදුකරන අපනයනයන් ලෝකයේ අනිකුත් රටවලට සිදු කරන අපනයනයන් වලට සාපේක්ෂව ඉතා ස්වල්පයක් බව පහත ප්‍රස්ථාරයට අනුව පැහැදිලි වේ.

මේ අනුව සැලකූ කල දැනට පවත්නා ඉන්දු - ලංකා භාණ්ඩ ගිවිසුම ශ්‍රී ලංකාව ආර්ථිකමය වාසි ලබන තත්ත්වයකට ගෙන ඒම සඳහා නිසි අධ්‍යනයක් සිදු කල යුතුය.

එලෙස අධ්‍යනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය නැවත නැවතත් පෙන්වා දීමට සිදු වන්නේ ඉන්දියාව විසින් සිදු කරන කූඨ උපක්‍රම නිසාවෙනි. ඉන්දියාව විසින් වෙළඳ පරතරය පවත්වා ගැනීමට අනුගමනය කරන කූඨ උපක්‍රම අචාර්ය ලලිත ශ්‍රී ගුණරුවන් මහතා ඇතුලු පිරිස විසින් සාරංශ ගත කරන ලද අධ්‍යනයක් කොට පෙන්වා දී ඇත.

| නිෂ්පාදනය | Measure [Ref : Moramudali, 2015] |
|---|---|
| මාබල් සහ ග්‍රැනයිට් තහඩු | කෘතිම ලෙස අවම ගොඩබෑම් මිලක් නියම කිරීම (US$ 80) was imposed on 26th August 2013. |
| නැවුම් පළතුරු සහ කල්තබා ගත නොහැකි දෑ | තත්ත්ව පරීක්ෂණ සඳහා දිගු කාලයක් ගත කිරීම |
| MDF ලෑලි | අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ බදු පැනවීම [Case: Merbok MDF Lanka Pvt Ltd ] |
| ඇඟලුම් | අපනයන තොග සීමා කිරීම [Case: Hirdaramani Group] |
| පොල් කිරි පිටි | නිර්ව්‍යාජ නිශ්පාදන සඳහා අනවශ්‍ය තත්ත්ව පරීක්ෂණ (errors by FSSAI accredited labs) |
| විස්කෝතු | ශ්‍රී ලංකාවේ පිහිටි ඉන්දිය ආයතන සඳහා බදු සහන සහ ශ්‍රී ලාංකිය නිෂ්පාදන සඳහා බදු පැනවීම |
| තේ | තත්ත්ව පරීක්ෂණ සහ ලේබල් කිරීම පමා කිරීම |
| මිශ්‍ර චොක්ලට් | සංයුක්ත චොක්ලට් වැනි දෑ සඳහා සීමා පැනවීම[Case : Anod Cocoa (Pvt) Ltd] |
| ශීත කල මස් වර්ග | ශ්‍රී ලාංකිය නිෂ්පාදන සඳහා අනුමැතිය ප්‍රමාද කිරීම |
| තඹ කම්බි/ රැහැන් | අපනයන සඳහා වරායේදි බාධා කිරීම |
| සියලු නිෂ්පාදන | දේශිය දේ ශ්‍රී ලාංකික නිශ්පාදන ලෙස සහතික නොකිරීම |

## II.අහිතකර අවාසි

උදාහරණයක් ලෙස ඉන්දු - ලංකා භාණ්ඩ ගිවිසුම සැලකූ කල එයින් ආර්ථිකමය වාසියක් නැතුවා පමණක් නොව ආර්ථිකමය නොවන හෝ වෙනත් වාසියක්ද සැලසී නැත. ඉන්දු - ලංකා ගිවිසුම නිසා මෙරට දියුණු වූ කිසිදු කර්මාන්ත ක්ෂේත්‍රයක් පැහැදිලිව දැක් විය නොහැකි වීම මෙයට කදිම උදාහරණයකි. එහිදී ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට අපනයනය කල ප්‍රධාන භෝගය වූ කරුංකාද ඉන්දුනීසියාවෙන් මෙරටට ගෙන්වා අපනයනය කල නිසා ශ්‍රී ලංකාවේ කරුංකා කර්මාන්තයේ දියුණුවක්වත් සිදු නොවිය. ඒ අනුව කිසිදු කර්මාන්තයක් මෙරට තුල දියුණු නොවිය.

| ස්ථානය | යුරෝපීය සංවිධානය (EU) 31% | ඇමරිකා එක්සත් ජනපදය (USA) 24% | ඉන්දියාව < 6% |
|---|---|---|---|
| 1 | ඇඳුම් | ඇඳුම් | “කරුංකා” |
| 2 | රබර් ටයර් සහ ටියුබ් | රබර් ටයර් සහ ටියුබ් | ඛණිජ තෙල් |
| 3 | ශීතකල මසුන් | රබර් අත්වැසුම් | ගම්මිරිස් |
| 4 | තේ පැකට් | මැණික් | සත්ව ආහාර |

එම නිසා පළමු පියවර ලෙස දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර ඒවා වාසි සහගත මගකට යොමු කිරීම අත්‍යවශ්‍යය.

## දෙවනුව — ජාතික වශයෙන් වැදගත් අංශ සුරක්ෂිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් නිසා <u>ජාතික ආරක්ෂාව</u>, <u>රටේ අනන්‍යතාවය</u>, <u>පුරවැසියන්ගේ සුරක්ෂිතභාවය</u> වැනි කරුණු වලට හානියක් සිදු නොවිය යුතුය. වෙළඳ ගිවිසුම් හරහා රටේ හෝ පුරවැසියාගේ ආරක්ෂාවට හානියක් නොවන බව තහවුරු විය යුතුය. එවැනි හානියක් සිදුවන තත්ත්වයක් ඇති වේ යැයි පැහැදිලි වුවහොත් එවැනි ගිවිසුම් වලට එළඹීමෙන් වැලකී සිටිය යුතුය. එවන් සුරක්ෂිතභාවයක් ඇති කර ගත හැක්කේ ‘ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්’ ස්ථාපනය කිරීමෙන් අනතුරුව පමණි.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොතිබුණද දියුණු, නොදියුණු බොහෝ රටවල ජාත්‍යන්තර වෙළඳාම සිදු කරනුයේ එවැනි ප්‍රතිපත්තියක සුරක්ෂිතතාවය යටතේය. උදාහරණයක් ලෙස ඉන්දියාව, වියට්නාමය, කෙන්යාව, උගන්ඩාව, ඉතියෝපියාව වැනි රටවල් දැක්විය හැක.

නිසි බලධාරීන්, රටේ විද්වතුන්, වෘත්තියවේදීන් හා අදාල අනිකුත් පාර්ශවයන් සමඟ එක්ව ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කර ජාතික වශයෙන් වැදගත් අංශ සුරක්ෂිත කිරීම දෙවන පියවරයි.

## තෙවනුව

## වෙළඳාම විවෘත වන ක්ෂේත්‍ර වල ආරාක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම

ද්විපාර්ශ්වික සේවා (රැකියාව) වෙළඳාමට ශ්‍රී ලංකාව විවෘත කිරීම, වෘත්තියමය හා තාක්ෂණික ක්ෂේත්‍ර වල නියාමනය ක්‍රමවත් කිරීමෙන් අනතුරුව සිදු කල යුතුය. වෘත්තියවේදියකු හෝ තාක්ෂණික ශිල්පියකු ලෙස ලංකාවේ අපේක්ෂිත ප්‍රමිතිය අදාල නියාමනයන් මගින් ආරක්ෂා නොකලහොත් සුදුසුකම් අඩු පිරිස් අඩු වැටුපට රැකියා සඳහා මෙරටට පැමිණෙනු ඇත.

*උදාහරණයක් ලෙස*

- ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සඳහා නිර්වචනයක් ඇතිමුත් පෞද්ගලික අංශයේ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා නිර්වචනයක් නොමැත.
- ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥයින් සහ තවත් විවිධ වෘත්තීන් සඳහා ශ්‍රී ලංකාව තුල නිශ්චිත නිර්වචනයක් නොමැත.

මෙවන් තත්ත්වයක් යටතේ අඩු සුදුසුකම් සහිත පිරිස් අඩු වැටුපට ඕනෑම වෘත්තියක වෘත්තියවේදියකු යැයි කියා ගනිමින් ශ්‍රී ලංකාවේ සේවා වෙළඳ පොළට ඇතුල්විය හැක. එවිට එම සේවා වල, අද ඇති ප්‍රමිතියටත් වඩා පහල තත්ත්වයකට ඇද වැටෙනු ඇත. ඒ තුලින් අප රට වර්තමානයේ පවතින සංවර්ධන මට්ටමින් තවත් පහළට ගමන් කරනු ඇත. ලොව තුල අප අත්පත් කරගෙන ඇති කීර්ති නාමයද එමගින් බිඳ වැටෙනු ඇත. තවද වෘත්තිය හා තාක්ෂණික ක්ෂේත්‍ර වල නියාමනය අක්‍රමවත් වුවහොත් අප රටේ දැනට සිටින ඉහල සුදුසුකම් සහිත පිරිස් රට හැර යනු ඇත. දේශිය මානව සම්පත පිරිහෙනු ඇත. එබැවින් වෘත්තිය හා තාක්ෂණික නියාමන ක්‍රමවේදයන් ස්ථාපනය කිරීමකින් තොරව අදාල සේවා, වෙළඳම සඳහා විවෘත නොකල යුතුය.

උදා:- ඉන්දියානු වෛද්‍යවරුන්ගේ ගුණාත්මකභාවය හොර දොස්තරලාට සමාන බව එහි සෞඛ්‍ය ලේකම් පසුගියදා පැවසිය.

**SUBSTANDARD INDIAN DOCTORS**

**ඉන්දියාවේ වෛද්‍යවරු පිළිබඳ**
**ඉන්දිය හිටපු සෞඛ්‍ය ලේකම් දරණ අදහස**



**Sujatha Rao,**

**FORMER INDIAN HEALTH SECRETARY**

**“The market has been flooded with doctors so poorly trained they are little better than quacks.”**

**“The government made it easier to open private medical schools because it lacked money to build public institutions - REUTERS/Adnan Abidi”**


ඉන්දියාවේ වසරකට ලක්ෂ 15ක් ඉංජිනේරුවන් බිහි කරන අතර, වසරක් තුලදී ඉන් ලක්ෂ 7කගේ ඉංජිනේරු වෘත්තියභාවය අත් හිටවනු ලැබේ.

**INDIAN ENGINEERS 47% UNEMPLOYABLE**

**The Tribune**

VOICE OF THE PEOPLE

*47% graduates in India unemployable: Report*




NEW DELHI, JUNE 24
India churns out tens of thousands of graduates every year but less than half of them are "employable" or possess the basic skills necessary for any industry role, says a report.

According to a report by Aspiring Minds, an employability solutions company, around 47 per cent graduates in India are unemployable for any job. The report, which is claimed to be the first ever national audit of employability of 3-year Bachelor's degree graduates, drew inferences from data of over 60,000 graduates pan-India, based on Aspiring Minds Computer Adaptive Test (AMCAT).

"The alarming statistics of nearly half of the country's graduates not being employable in the knowledge economy needs great attention with interventions at both the school and higher education levels," Aspiring Minds co-founder and CTO Varun Aggarwal said.

The employability of graduates varies from 2.59 per cent in functional roles such as accounting, to 15.88 per cent in sales related roles and 21.37 per cent for roles in the business process outsourcing (BPO/ITeS) sector.

A significant proportion of graduates, nearly 47 per cent, were found not employable in any sector, given their insufficient English language and cognitive skills.

The report noted since a graduation degree is considered a pathway to a job in the knowledge economy, substantive intervention at school and college level is needed to improve basic skills of students. — PTI

**ඉංජිනේරුවන් :-**

**ඉන්දියාවෙන් වසරකට 1500000**

**ශ්‍රී ලංකාවෙන් වසරකට 2000**


එම නිසා තෙවන පියවර ලෙස, ජාත්‍යන්තර වෙළඳාමට විවෘත වන ක්ෂේත්‍ර වල ආරක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම අනිවාර්ය වේ.

## සිව්වනුව

## වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂිත වන අරමුණු නිර්වචනය කල යුතුය

වෙළඳ ගිවිසුමකට එළඹිමට ප්‍රථම ඒ තුලින් අපේක්ෂිත අරමුණු නිර්ණය කර ගත යුතු අතර එම අරමුණු කොතරම් දුරට ප්‍රායෝගිකද යන්න, කෙසේ සාක්ෂාත් කර ගන්නේද යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක්, දර්ශණයක් ලබා ගත යුතුය.

උදාහරණයක් ලෙස වර්තමානයේ රැකියා 1,000,000 ක් ස්ථාපනය කිරීමට වගකිව යුතු දේශපාලඥයින් අපේක්ෂා කලද ශ්‍රී ලංකාවේ වර්තමානයේ විරැකියාව මහා බැංකු වාර්තාව අනුව 450,000 ක් පමණි.




එමගින් පැහැදිලි වන්නේ වර්තමාන රජය නිශ්චිත අරමුණකින් තොරව කටයුතු කරන බවයි. එම නිසා සිවු වන පියවර ලෙස වෙළඳ ගිවිසුමට එළඹිමට මත්තෙන් අපේක්ෂිත අරමුණු පැහැදිලිව නිර්වචනය කලයුතුය.

වෙළඳ ගිවිසුමට එළඹිමෙන් පසු එම අරමුණු ඉටු කර ගැනිමට නොහැකි වුයේ නම් ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන් නම් කිරීමද ගිවිසුමට එළඹිමට මත්තෙන් සිදු කල යුතුය.

## පස්වනුව

## ක්‍රියාපටිපාටිය තුල පිළිපැදිය යුතු මූලධර්මයන් ස්ථාපිත කිරීම

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සකස් කිරීමේදි.

1. පූර්ණ විනිවිදභාවයකින් යුක්ත විය යුතුය.
2. ගිවිසුමේ අදාල අංශ වල **වගකීම** සහ **වගවීම** තහවුරු කල යුතුය.
   නිසි බලධාරින් විද්වතුන් වෘත්තියවේදින් සහ ගිවිසුමට අදාල වන අනිකුත් පාර්ශව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගිවිසුම සකස් කල යුතුය.
3. ගිවිසුමෙන් ඇති වන වාසි සහ අවාසි නිර්ණය කිරීමේ හැකියාව ඇති ප්‍රායෝගික ක්‍රියා පටිපාටියක් ඇති කල යුතුය.

# IV

# ජාත්‍යන්තර වෙළඳ
# ගිවිසුම්
# පිළිබඳ වගකීම දැරීමේ
# ආයතන හා පුද්ගලයන්

## 4.1 වගකීම් දරණ අධිකාරිය

රටක් වශයෙන් ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වලට එළඹීමට මත්තෙන් කල යුතු කාර්යයන් කිහිපයක් පවති. ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් වලට එළඹීමට මත්තේන් ඒ ගිවිසුම් වලින් යහපතක් අත් කර ගැනිමට නම් ජාතික ප්‍රතිපත්තියකට අනුව කටයුතු කල යුතුය. නමුත් අප රටේ එවන් ජාතික ප්‍රතිපත්තියක් නොමැත. රටක් වශයෙන් ගත් කල එය ඉතා දුර්වල අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. එම නිසා ජාත්‍යන්තරය සමගින් වෙළඳ ගිවිසුම් වලින් අත්වැල් බැඳ ගැනිමට මත්තෙන් අප රටේ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සම්බන්ධ වු ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කල යුතු බව අවධාරණය කරමු.

ප්‍රතිපත්තියක් සකස් කිරිම සඳහා **පළමුව අධිකාරියක් පිහිටු විය යුතුය.** ජනාධිපතිතුමන් විසින් තම විධායක බලය යොදා ගනිමින් නිල වශයෙන් අධිකාරියක් හෝ කොමිසමක් නිල වශයෙන් බිහිකල යුතුය. නිල වශයෙන් පිහිටුවන ලද එම අධිකාරියට ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සම්බන්ධ සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සැකසුම් සඳහා අවශ්‍ය වන නිල බලය අදාල ගැසට් පත්‍රයේ නිල වශයෙන් හා නිත්‍යානුකුල වශයෙන් පැවරිය යුතුය.

එලෙස බිහි වන බලයලත් නිල ආයතනය විසින් විවෘතව **මහජන අදහස්** ලබා ගැනිම සඳහා ප්‍රසිද්ධ දැන්විම් පල කල යුතුය. එවිට පුද්ගලිකව හෝ සංවිධාන වශයෙන් ඉදිරිපත් වන යෝජනා අනුව ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත් කල යුතුය.

කෙටුම්පත් කරන ලද ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මහජනයාගේ අදහස් සඳහා පාරදෘශ්‍ය අයුරින් එළි දැක්විය යුතුය. ඉන් පසු එය **අනුමැතිය** සඳහා කැබිනට් මණ්ඩලයටත් අවසානයේ පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කල යුතුය.

ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳ එලෙස පිහිටුවන ජාතික ප්‍රතිපත්තියට අනුකුලව ජාත්‍යන්තර වෙළඳ **ගිවිසුම් සම්පාදනය** කල යුතුය.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ජාතික වැටුප් ප්‍රතිපත්තිය බිහි කිරීමේ කල ප්‍රායෝගික ක්‍රියාපටිපාටියේදී පහත සඳහන් පියවරයන් අනුගමනය කරන ලදී.

- රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය කල ඉල්ලීමට අනුව ජනාධිපතිතුමිය ගැසට් මගින් ජාතික වැටුප් කොමිසම පත් කරන ලදී
- පත් කරන ලද ජාතික වැටුප් කොමිසම බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ස්ථාපිත කරන ලදී
- ඒ අනුව පුද්ගල, වෘත්තිය සමිති, ආයතන ආදී අයගෙන් ජාතික වැටුප් ප්‍රතිපත්තිය සැකසීම සඳහා අදහස් හා යොජනා ඉදිරිපත් කරන ලදී
- එම අදහස් හා යෝජනා මත පදනම්ව ජාතික වැටුප් ප්‍රතිපත්තිය එලි දක්වන ලදී
- ඒ අනුව එම ප්‍රතිපත්ති කැබිනට්/ පාර්ලිමේන්තු අනුමැතිය යටතේ අයවැය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී

මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ජාතික වැටුප් ප්‍රතිපත්තිය සැකසූ අතර වර්තමානයේ කිසිදු අපහසුවකින් තොරව එම ප්‍රතිපත්තියට අනුව කටයුතු කෙරේ. ජාත්‍යන්තර ඇගයිමටද පාත්‍ර වි ඇත.

නමුත් මෙවැනි නිවැරදි ක්‍රියාපටිපාටියකින් තොරව ඉන්දු - ලංකා වෙළඳ ගිවිසුම අත්සන් කිරීමට වර්තමාන රජය උත්සාහ ගනිමින් සිටියි. ඉන්දු - ලංකා ගිවිසුම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව ජනාධිපතිතුමා ඇතුලු දේශපාලනඥයින් පවසන අතර නැවත නැවත අප අවධාරණය කරනුයේ එය නිවැරදි ක්‍රියා පිළිවෙත නොවන බවයි. **සත්‍ය වශයෙන්ම සිදු විය යුත්තේ ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් බිහිකොට ඒ ඔස්සේ කටයුතු කරමින් ඉන්දු - ලංකා ගිවිසුමට ප්‍රවිෂ්ඨ විමයි.**


උත්තරීතර පාර්ලිමේන්තුව රටේ සියලු කටයුතු පිළිබඳ තීරණ ගන්නා අවසන් තීරකයා වේ. නමුත් ප්‍රතිපත්තියකින් තොරව ගන්නා ලද තීරණයකට පාර්ලිමේන්තුව හරහා අනුමැතිය ලබා දිමට කටයුතු කිරීම නිසි ක්‍රමවේදය නොවේ. ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකිම පාර්ලිමේන්තුව පිට පටවා එය පාර්ලිමේන්තුවෙන් සකස් කරන තෙක් සිටිය යුතු නොවේ. දැනට පවතින වෙළඳ ගිවිසුම් සඳහා තීරණ ගනු

ලබනුයේ පාර්ලිමේන්තුව මගිනි. නමුත් වර්තමාන පාර්ලිමේන්තුවේ පහත අඩු පාඩුකම් දක්නට තිබේ.

1. වෙළඳ ගිවිසුම් පිළිබඳ විශේෂඥ දැනුමක් නොමැති වීම
2. මේ පිළිබඳ අත්දැකීම් අඩු බව
3. දේශපාලන පක්ෂයට හෝ පක්ෂ වලට ගැතිවීම
4. පෞද්ගලික බැදීම්

එබැවින් පාර්ලිමේන්තුවේ වගකීම වනුයේ වෙළඳ ගිවිසුම් මගින් සිදු වන වාසි අවාසි දෙකටම වගකීම දරණ වගකිව යුතු අධිකාරියක් ස්ථාපිත කිරීමයි. එයට ස්වාධීන දේශප්‍රේමී නිලධාරීන් අනුයුක්ත කල යුතු අතර එම අධිකාරිය මගින් නිවැරදි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් ක්‍රියාත්මක විය යුතුය. සිදු විය යුතු වන්නේ අදාල අධිකාරියක් පත් කොට එම අධිකාරියට ප්‍රතිපත්ති සැකසීමේ කටයුතු භාර දීමයි. පත් කරන ලද අධිකාරිය විසින් තම රාජකාරිය නිවැරදිව තේරුම් ගෙන රටේ අවශ්‍යතාවද තේරුම් ගෙන කටයුතු කල යුතුවේ. එසේම වෙළඳ ගිවිසුමේ උපදේශන ක්‍රියාවලිය සහ විශ්ලේෂණය මෙම අධිකාරිය මගින් කල යුතුය. සිදු වන අවාසියකදි වගකීම දැරිය යුත්තේ මෙම අධිකාරියයි.

ප්‍රතිපත්ති සැකසීමට පත් කල අධිකාරියේ වගකීම වනුයේ මහජන, විද්වත්, වෘත්තිකයන් හා පුජ්‍ය පක්ෂය වැනි කොටස් වලින් අවශ්‍ය තොරතුරු ලබා ගෙන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමයි. සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය, අනුමැතිය ලබා ගැනිම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ඉන් පසුව කල යුතු වේ.




**සටහන: ගිවිසුමකට යා යුතු නිවැරදි මඟ**

## 4.2 සිදු නොවිය යුත්ත

1. ප්‍රතිපත්තිමය තිරණ වෙනුවට දේශපාලඥයින් තිරණ ගැනිම
2. පුරවැසියා වික්ෂිප්ත වන ජාත්‍යන්තර උපාය මාර්ග වලට හසුවීම
3. ක්‍රියාවලියේ පාරදෘෂ්‍යභාවයක් හා ස්ථාවරභාවයක් නැතිකම
4. දැන් ගිවිසුම් සකස් කරන්නේ නුසුදුසු අය විම
5. සිදුවන පාඩුවට වගකීම දරන්නෝ නැතිවීම
6. උපදේශනය කරන පිරිස් දේශපාලඥයන්ව නොමඟ යවමින් කටයුතු කිරීම
7. පවතින ගිවිසුම් විවරණයකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක විම
8. ශ්‍රී ලාංකිය ශ්‍රම බලකායේ ඇති අඩුපාඩුකම් හඳුනා ගෙන නිවැරදි කිරීම වෙනුවට ඉන්දිය ශ්‍රමිකයන් ආනයනය කිරීමට උත්සහ කිරිම
9. දුර දිග නොබලා පටු වාසි අරමුණු කරගෙන කටයුතු කිරිම
10. රටට ආදරේ ඇති පිරිස් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම
11. රජයෙන් සිදු වන අකටයුතුකම්

## 4.3 නිදහස් අධ්‍යාපනය සැබෑ ප්‍රයෝජනයක් විමට නම්...

**රට වෙනුවෙන් වගකීම**

- නිදහස් අධ්‍යාපනය තිබෙන රටක් ලෙසින් එහි පල ප්‍රයෝජනය රටට ලැබිය යුතුය.
- විද්වතුන් නිදහස් අධ්‍යාපනයේ විපුලභාවය ලැබෙන ආකාරයෙන් නිවහල්ව කටයුතු කල යුතුය.
- දේශපාලඥයින් ප්‍රතිපත්තිගරුකව කටයුතු කල යුතුය.
- සියලුම පුරවැසියන් හැකි පමණින් මේ පිළිබඳ සොයා බලා ප්‍රතිපත්තිමය තිරණ ගන්නා ක්‍රියා මාර්ගයකට රට යොමු කල යුතුය

මේ සම්බන්ධ වැඩි විස්තර දැන ගැනිම සඳහා පිවිසෙන්න අපගේ නිල වෙබ් අඩවිය වන www.gmoa.lk වෙත.

# ඇමුණුම්

1. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා වෙත දන්වා යවන ලද ලියමන
2. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ජාත්‍යන්තර ඉන්දියානු සමාගමක් මගින් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමට නියමිත හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාව පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා වෙත දන්වා යවන ලද ලියමන
3. රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් ශ්‍රී ලංකාවට වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබඳව දන්වා අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා වෙත යොමු කරන මහජන පෙත්සම
4. ලංකාදීප - 2016 ජනවාරි මස 02 වැනි සෙනසුරාදා
5. දිවයින - 2016 ජනවාරි මස 26 වැනි සෙනසුරාදා

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත දන්වා යවන ලද ලියමන

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/President/2016/0001
2016/01/04

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමණි,

**ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය**

ඉන්දු ලංකා වෙළඳ හෝ සහයෝගිතා ගිවිසුමක් මේ වර්ෂය තුලදී අත්සන් කරන බව රජය ප්‍රකාශ කර ඇත.

වෙළඳ ගිවිසුම් තුලින් රටේ අනන්‍යතාවයටත්, පුරවැසියන්ගේ සුරක්ෂිතභාවයටත් හානියක් නොවන අයුරින් එය සැකසිය යුතුය. එපමණක් නොව ඒ තුලින් රටට සහ රට වැසියන්ට අන්‍යෝන්‍ය වශයෙන් වාසියක් සැලසිය යුතුය. දැනට පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමෙන් ලංකාවට වාසියක් අත් වී නැත. එම ගිවිසුමට උපදේශනය ලබාදුන් පිරිස සහ එය සැකසූ අය එහි වගකීම භාර ගන්නා බවක්ද පෙනෙන්නට නැත. එහි පාඩුව රටේ පුරවැසියන් විඳ දරා ගත යුතුව ඇත. හෙයින් ගිවිසුමෙන්ද මේ අයුරින්ම සිදුවූ විශාල අලාභය පරම්පරා ගණනක් අප ගෙවිය යුතුය.

මෙවැනි ද්විපාර්ශවික ගිවිසුම් ලංකාවේ අධිකරණය අභිබවා යයි. ගිවිසුමක ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමකට ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය තාක්ෂණික හා නීතිමය වශයෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා සංකීර්ණ හා අපහසු කටයුත්තක් වන අතර අති මහත් මුදල් සම්භාරයක් වැය වන කටයුත්තකි. එය ශ්‍රී ලංකාව වැනි රටකට ඔරොත්තු නොදෙන තරමේ කටයුත්තක් බව හෙජින් ගිවිසුම බේරුම්කරණයේදී මනාව පැහැදිලි විය.

මේ වසරේ අත්සන් කරන බව පවසන ඉන්දු ලංකා ගිවිසුම උපදේශනය කරන පිරිසත්, එය සකස් කරන පිරිසත්, එහි පාරදෘෂ්‍යභාවය රකින බවක් පෙනෙන්නට නැත. කෙසේ නමුත් ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා යම් තොරතුරු ප්‍රමාණයක් අප වෙත ලබා දීමට ගත් උත්සාහය අපි අගය කරමු. නමුත් මේ ගිවිසුම තුලින් අපේ රටට සිදුවේ යැයි පවසන වාසිය ගැන අප සාමාජිකත්වය පැහැදී නැත. ඇත්ත වශයෙන්ම මෙම ගිවිසුම තුලින් දැනට අවාසි සහගත තත්ත්වයක් පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමට වඩා විශාල හානියක් වනු ඇතැයි ඔවුන්ගේ මතය වී ඇත.

එබැවින් **ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැකසීම කළ යුතු බවත්, එතෙක් ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම අත්සන් නොකල යුතු බවත්** අපි යෝජනා කරමු. ඒ තුලින් සැකයට සහ නොසන්සුන්තාවයට ලක්ව ඇති බොහෝ කාරණා විශ්ලේෂණයකට ලක් වනු ඇත.

අත්තනෝමතික තීරණ වලට වඩා ප්‍රතිපත්ති ගරුක තීරණ වලට හිස නවන රාජ්‍යයක් බිහි කිරීමට නායකත්වය දුන් ඔබතුමාගෙන්, අපගේ මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස අපි ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි,

වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය
සභාපති

වෛද්‍ය නලින්ද හේරත්
ලේකම්

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ජාත්‍යන්තර ඉන්දියානු සමාගමක් මගින් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමට නියමිත හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාව පිළිබඳව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත දන්වා යවන ලද ලියමන

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/President/2016/0005
2016.02.18

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමණී,

**ඉන්දියානු සමාගමක් මගින් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීමට නියමිත හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාව පිළිබඳවයි.**

ශ්‍රී ලංකාව තුළ "හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක්" ස්ථාපිත කිරීම සඳහා ඉන්දියානු රාජ්‍ය නොවන ආයතනයකට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක MNPEA/2015/108 මගින් කැබිනට් අනුමැතිය ලබා දී ඇත. (ඇමුණුම 01)

ඉන්දියානු M/s GVK Emergency Management and Research Institute(EMRI) නමැති ප්‍රතිකාර හා පර්යේෂණ ආයතනයක් ඇත. ලංකාවේ ප්‍රතිකාර සේවාව සැලසීම සඳහා EMRI ආයතනය, නව ආයතනයක් ලංකාවේ බිහි කරනු ඇත.

මෙම ඉන්දියානු රාජ්‍ය නොවන ආයතනයට, සෞඛ්‍ය අමාත්‍යංශයේ අනුබද්ධිත ආයතනයක් ලෙස කටයුතු කිරීමට කැබිනට් පත්‍රිකාවෙන් විශේෂ අනුමැතියක් ලබා දී ඇත.

කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර ඇත්තේ විෂය භාර සෞඛ්‍ය ඇමතිතුමා නොව ගරු අගමැතිතුමා බව දක්නට ඇත.

"හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක්" යනු රෝගී ප්‍රතිකාර සේවාවට අලුතින් එක් වන ව්‍යුහාත්මක වෙනසක් මිස, ගිලන් රථ රියදුරන්ගේ වෘත්තිය සමිති ගැටලුවක් නොවේ.

"හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක්" ස්ථාපිත කිරීම සරල ක්‍රියාවක් නොවේ. සාමාන්‍ය රෝහලක සිදු වන ප්‍රතිකාර සේවයට වඩා සංකීර්ණ ක්‍රියාදාමයකි. ප්‍රතිකාර සේවාවට අමතරව, සන්නිවේදන කටයුතු, තොරතුරු තාක්ෂණ, රෝගී දත්ත ගබඩා පවත්වා ගැනීම, කාර්යක්ෂම ප්‍රවාහනය සැලසීම, පොලිසිය වැනි අංශ සම්බන්ධීකරණයද අයත් වේ.

රෝගී සේවා ව්‍යුහය වෙනස් කරමින් සංකීර්ණ නව අංගයක් එක්කරනා යෝජනාවට කැබිනට් අනුමැතිය ලබාදී ඇත්තේ අප සංමය ඇතුලු අවශ්‍ය පාර්ශව සමඟ සාකච්ඡා නොකර බව අපි දන්වා සිටිමු.

හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර සංකල්පය අප රටට සුදුසු දෙයක් යැයි අපට හැගුනත්, එය ක්‍රියාත්මක කිරීමට පෙර එවන් සේවාවක අවශ්‍යතාවය පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් අවශ්‍ය බවත්, එවැනි සේවාවක් ක්‍රියාත්මක කරන්නේ නම් එය **දේශිය යාන්ත්‍රණයකින් පමණක්ම** කළ යුතු බවත් අපගේ මතයයි. දේශිය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේදී විදේශයන්හි ඇති **"**යහපත් දේ**"** අධ්‍යනය කිරීම, උපදේශනය ලබා ගැනීම හා පුහුණුව සඳහා හවුල් කර ගැනීමේ වරදක් නැත. නමුත් මෙලෙස ව්‍යාපෘතිය විදේශිය පිරිසකට ලබා දීම ගැන අපි තරයේ විරුද්ධ වෙමු.

ඉන්දු - ලංකා ගිවිසුමේ තිබු කොටස් වලින් සෞඛ්‍ය බැහැර කලා යැයි රජය නිවේදන නිකුත් කරමින්, එය ව්‍යාපෘති වශයෙන් මෙලෙස ක්‍රියාත්මක කලවිට, CEPA ගිවිසුම හරහා සිදුවීමට තිබු අගතිය එලෙසින්ම සිදුවනු ඇත.

කිසිදු ස්වාධීන රාජ්‍යයක් සිදු නොකරන ආකාරයෙන් රාජ්‍ය නොවන විදේශ ආයතනයකට, පෙර හා පසු නිසි අධ්‍යනයකින් හෝ ඇගයීමකින් තොරව, එකි ඇමති මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇති බව පෙනෙන අතර අප විසින් නිරීක්ෂණය කල, රටට අහිතකර කරුණු ඔබතුමාගේ අවධානයට යොමු කරමු.

- සේවකයින් පත් කිරීම හා විනය බලධාරියා
- ප්‍රසම්පාදනය
- දත්ත ගබඩා සකස් කිරීම
- ජාතික ආරක්ෂාව හා රටේ ආර්ථිකය

**සේවකයින් පත් කිරීම හා විනය බලධාරියා**

- මෙම සේවාව සඳහා විශේෂ වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්නන්, ගිලන් රථ සේවා සපයන්නන්, සන්නිවේදකයන් වැනි පිරිස් බඳවා ගැනේ. සෞඛ්‍ය වෘත්තිකයන්ගේ "පත් කිරීමේ හා විනය බලධාරියා" රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාය. එම තත්ත්වය උල්ලංඝණය වන අයුරින් කැබිනට් පත්‍රිකාවේ 3 වෙනි ඡේදයේ *"කාර්ය මණ්ඩල තෝරාගැනිම, බඳවා ගැනිම, මාරු කිරීම, සේවය අවසන් කිරීම සහ මේ සඳහා සමස්ථ මෙහෙයුම් වියදම තුළ මුදල් වෙන්කිරීමට අදාල <u>මෙහෙයවීමේ නිදහස සහ ස්වාධීනත්වය</u> M/s GVK EMRI ආයතනයට ලබා දෙමින් මෙම ආයතනය ස්වාධීනව ක්‍රියාත්මක වනු ඇත"* යනුවෙන් සඳහන් වේ.

- මේ අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අනුබද්ධිත ආයතනයක, "පත් කිරීම් හා විනය බලතල" ඉන්දිය රාජ්‍ය නොවන ආයතනයකට සමස්ථ වශයෙන්ම, <u>නිදහස්ව හා ස්වාධිනව</u> සිදු කිරීමට භාරදීම පිළිගත නොහැකි බරපතල කාරණාවකි.

- සේවකයින් ශ්‍රී ලාංකිකයන් විය යුතු යැයි සඳහන් නැත. ඉන්දියානු වැසියන්ට රැකියා වීසා ලබා දිම සඳහා රාජ්‍ය අනුග්‍රහය සලසා ඇත.

- පිරිස් බඳවා ගැනිමට 09.02.2016 දින "ලංකාදීප" දැන්වීම අනුව ගිලන් රථ සේවකයෙකුට පැය 12 ක සේවා මුරයක් සඳහා සියලුම දීමනාද සහිතව වැටුප රු 25000කට සීමා කර ඇත. තවද පෙබරවාරි 10 වෙනිදා සම්මුඛ පරීක්ෂණයට අදාල දැන්වීම පල කර ඇත්තේ පෙබරවාරි 9 වන දිනය. ඉල්ලුම් කිරීමට ලබා දී ඇත්තේ පැය 24කි. අඩු වැටුපත්, කාලය ලබා නොදිමත් නිසා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික අයදුම්කරුවන් මේ සඳහා ඉල්ලුම් කිරීම අඩු විය හැක. එවිට අඩු වැටුපට ඉන්දියානු පුරවැසියන් බඳවා ගැනිමට අවස්ථාව සැලසේනු ඇත.

- ගිලන් රථ රියදුරකුගේ <u>ප්‍රමිතිය</u> පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්ද බිහිකර නැති නිසා රෝගි ප්‍රතිකාර සේවා වල ප්‍රමිතියටද මේ හරහා බලපෑම් එල්ල වනු ඇත.

- සේවකයින් නිර්වචනය කර නැත. අදාල සේවකයින් වෛද්‍ය <u>ආචාර ධර්ම</u> හා නිතියට ඇති බැඳීම පැහැදිලි නැත.

**ප්‍රසම්පාදනය**

- ගිලන් රථ ප්‍රසම්පාදනය, ගිලන් රථ නිසි පරිදි සකස් කිරීම, වෛද්‍ය උපකරණ මිලදී ගැනිම, සන්නිවේදන උපකරණ, පරිඝණක මෘදුකාංග, ජාලගත කිරීම, බලපත්‍ර හා පුහුණුවීමේ උපකරණ ආදිය ලබා ගැනිම වැනි කටයුතු සඳහා එම ආයතනයට ස්වාධීන බලතල ලබා දී ඇත. ජාතික ආරක්ෂාවටත් සෞඛ්‍යයටත් තර්ජනයක් විය හැකි තාක්ෂණික හා වෛද්‍ය උපකරණ මිලදී ගැනිම පිළිබඳ ප්‍රසම්පාදන ප්‍රතිපත්ති පැහැදිලිව උල්ලංඝණය කිරීම භයානයකය.

**දත්ත ගබඩා සකස් කිරීම**

- M/s GVK Emergency Management and Research Institute (M/s GVK EMRI) යන ආයතනය, එම ආයතනයේ නමින්ම පර්යේෂණ(Research) ආයතනයකි. රෝගි සත්කාරක සේවාවකදී පුද්ගලයින්ගේ <u>රහසිගත දත්ත</u>, දිවිපැවතුම් ඇතුලු අතිශය පුද්ගලික දත්ත වලට ඇතුලු විමට අවකාශය සැලසේ. එමගින් වාණිජ අගනගරය වන කොළඹ ඇතුලු බස්නාහිර හා දකුණු පලාත් වල වැසියන්ගේ දත්ත ගබඩාවක් සකසා ගැනිමට මෙම ආයතනයට අවකාශ සැලසී ඇත. ලැබෙන රාජ්‍ය අනුග්‍රහයද ඒ සඳහා ලැබෙන මහගු පිටුවහලකි. රෝගි දත්ත ගබඩාවක දත්ත සම්බන්ධයෙන් පිළිපැදිය යුතු <u>ආචාර ධර්ම හා නිතිය</u> සුරැකිම පිළිබඳ සහතිකයක් නැත. තවද මෙවන් <u>දත්ත ගබඩාවක වාණිජ වටිනාකම</u> කෙතරම් විශාලද යන්න ඔබට අමුතුවෙන් කිව යුතු නැත.

**ජාතික ආරක්ෂාව හා රටේ ආර්ථිකය**

- මෙම හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවට රටේ බෝහෝ ස්ථාන වලට ඇතුල්විමේ වරප්‍රසාද හිමි වේ. කැබිනට් පත්‍රකාවෙන්ද එය බෙහෙවින් තහවුරු කරයි. පොලිසිය, ගිනි නිවන හමුදාව මෙන්ම සෞඛ්‍ය අමාත්‍යංශය ඇතුලු සියලුම ආයතන මෙම ගිලන් රථ සේවාව සමඟ සම්බන්ධිකරණයෙන් කටයුතු කල යුතු බව සඳහන් කර ඇත. මේ අනුව <u>දේශපාලඥයින්</u> හා රටේ <u>වාණිජ හා ආරක්ෂක මෙහෙයුම් පද්ධතිය ක්‍රියාත්මක කරන බොහෝ පිරිස්</u> සහ <u>ස්ථාන වල දත්ත නිරීක්ෂණයට</u> නෛතික අයිතියත්, ප්‍රායෝගික අවස්ථාවත් සැලසෙනු ඇත. එය ජාතික ආරක්ෂාවට හා රටේ ආර්ථිකයට බලපාන අනතුරුදායක කරුණකි.

- උක්ත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව "<u>**විශේෂ වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන්නන්"**</u> අනුයුක්ත කිරීමේදී ඔවුන්ගේ ප්‍රමිතිය, ආචාර ධර්ම හා නිති පද්ධතිය කවර අයුරකින් ක්‍රියාකරන්නේද යන්න අපැහැදිලිය. එය සෞඛ්‍ය ක්ෂේත්‍රයට මෙන්ම ඉන් ඔබ්බට යන ආර්ථික හා ජාතික ආරක්ෂාව දක්වා ගැටලු මතු කරන්නකි.

ස්තූතියි,

වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය
සභාපති

වෛද්‍ය නලින්ද හේරත්
ලේකම්

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකාවට වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය පිළිබඳව දන්වා අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙත යොමු කරන මහජන පෙත්සම

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

**ශ්‍රී ලංකාවට වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය**

ඉන්දු - ශ්‍රී ලංකා භාණ්ඩ සේවා වෙළඳ ගිවිසුම මේ වර්ෂය තුළදී අත්සන් කරන බව රජය ප්‍රකාශ කර ඇත. නමුත් වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට නැත.

වෙළඳ ගිවිසුම් තුලින් ජාතික ආරක්ෂාවටත්, රටේ අනන්‍යතාවයටත්, පුරවැසියන්ගේ සුරක්ෂිතභාවයටත් හානියක් නොවන අයුරින් එය සැකසිය යුතුය. එපමණක් නොව ඒ තුලින් රටට සහ රට වැසියන්ට අන්‍යෝන්‍ය වශයෙන් වාසියක් සැලසිය යුතුය. දැනට පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමෙන් ලංකාවට වාසියක් අත් වී නැත. එම ගිවිසුමට උපදේශනය ලබාදුන් පිරිස සහ එය සැකසූ අය එහි වගකීම භාර ගන්නා බවක්ද පෙනෙන්නට නැත. එහි පාඩුව රටේ පුරවැසියන් විඳ දරා ගත යුතුව ඇත. හෙයින් ගිවිසුමෙන්ද මේ අයුරින්ම සිදුවූ විශාල අලාභය පරම්පරා ගණනක් අප ගෙවිය යුතුය.

නමුත්, ඒක පාර්ශවික වෙළඳ ගිවිසුම් හරහා දැනටමත් ඉන්දියානුවන් ලංකාවේ රැකියා සඳහා පැමිණේ. නමුත් ඔවුන්ගෙන් අවදානමක් සිදුවූ විට ශ්‍රී ලාංකිකයින්ට අප අධිකරණයේ පිහිට ලබා ගත හැක. නමුත්, ද්විපාර්ශවික ගිවිසුම් ලංකාවේ අධිකරණය අභිබවා යයි. එවැනි අවස්ථාවක ගිවිසුමක ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමකට ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය තාක්ෂණික හා නීතිමය වශයෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා සංකීර්ණ හා අපහසු කටයුත්තක් වන අතර අති මහත් මුදල් සම්භාරයක් වැය වන කටයුත්තකි. එය ශ්‍රී ලංකාව වැනි රටකට ඔරොත්තු නොදෙන තරමේ කටයුත්තක් බව හෙජින් ගිවිසුම බේරුම්කරණයේදී මනාව පැහැදිලි විය.

එබැවින්,

**ශ්‍රී ලංකාවේ අධිකරණය අභිබවා යන මෙවන් ද්විපාර්ශ්වික ගිවිසුම් මගින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම සඳහා ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැකසීම කඩිනමින් කළයුතු බව අපි අවධාරණය කරමු.** ඒ සඳහා,

- පළමුව දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර එය රටට වාසි වන මගකට යොමු කර ගත යුතුය.
- දෙවනුව ජාතික ආරක්ෂාව සහ වැදගත් අංශ සුරක්ෂිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කල යුතුය,
- තෙවනුව වෙළඳාම සඳහා විවෘත වන ක්ෂේත්‍ර වල සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපනය කල යුතුය.
- සිව්වනුව වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂිත අරමුණු නිර්වචනය කර, ප්‍රායෝගිකව පැහැදිලි අයුරින් එළි දැක්විය යුතුය.
- පස්වනුව මෙම ක්‍රමවේදයන් තුළ පාරදෘෂ්‍ය වගකීම් සහිත මූලධර්ම ස්ථාපනය කල යුතුය.

ඉන්පසු රටට වාසිදායක ලෙස වෙළඳ ගිවිසුම් වලට එළඹිය හැක.

අත්තනෝමතික තීරණ වලට වඩා ප්‍රතිපත්තිගරුක තීරණ වලට හිස නවන රාජ්‍යයක් බිහිකිරීමට ඉදිරිපත් වූ ඔබතුමාගෙන්,

1. **වෙළඳ ගිවිසුම් සම්පාදනය පිළිබඳ වගකිව යුතු අධිකාරියක්/ කොමිෂන් සභාවක් පිහිටුවන ලෙසත්,**
2. **එමඟින් වෙළඳ ගිවිසුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලෙසත්**
3. **එතෙක්, කිසිවෙකුගේ පැහැදිලි වගකීමකින් තොරව සම්පාදනය කරන ඉන්දු - ලංකා ගිවිසුම/ ගිවිසුම් රාමුව/ එකඟතාවය අත්සන් නොකරන ලෙසත්,**

කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූතියි,

# ඉන්දු-ශ්‍රීලංකා ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මේ වසරේ

## ඇමැති මලික් නිවේදනයකින් කියයි

(අංජුල මහිකා වීරරත්න)

"ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මේ වසරේ මැද භාගයේදී අත්සන් කරන බව සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා විශේෂ නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශකර සිටී.

නවදිල්ලියේ පැවැති සාකච්ඡාවලට අදාළව සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයේ මෙසේ සඳහන්ය.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර 4 වැනි වාණිජ ලේකම් මට්ටමේ සාකච්ඡාව නවදිල්ලියේදී පවත්වන ලදී. මෙවර සාකච්ඡාවේ මූලික අභිප්‍රාය වූයේ පවත්නා ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම මීළඟ අදියරේදී වඩාත් පුළුල් සහයෝගිතා ක්ෂේත්‍රයක් ආවරණය වන පරිදි ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම ලෙසට පරිවර්තනය කර ගැනීමය.

යෝජිත සහයෝගිතා රාමුව තුළ ශ්‍රී ලංකාව විසින් වෘත්තීමය ශ්‍රම නිදහස්කරණය නැව් තැනීමේ හා තොරතුරු තාක්ෂණ යන වෘත්තීන් දෙකට පමණක් සීමා කිරීමට බලාපොරොත්තුවේ. එසේම ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට වඩා හොඳින් ඉන්දීය වෙළෙඳ පොළට අවතීර්ණ වීමට අවස්ථා ගැනීම අවධාරණය කරන ලද අතර දැනට දේශීය අපනයනකරුවන් ඉන්දීය වෙළෙඳපොළ තුළ මුහුණ දෙන ගැටලු ගණනාවක් ගෙනහැර දක්වන ලදී.

ඊ අනුව ඉන්දීය පාර්ශ්ව විසින් ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම් අරභයා දෙරට අතර කරන සාකච්ඡාවලට සමගාමීව ගැටලුවලට විසඳුම්දීමට කටයුතු කරනු ඇත. ඊ අතරම වෙළෙඳ භාණ්ඩවල ප්‍රමිතීන් සම්බන්ධයෙන් අන්‍යොන්‍ය තත්ත්ව සහතික පිළිගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමටද එකඟතාව පළ කරන ලදී.

තවද 2016 ජනවාරි-පෙබරවාරි මාසවල දී ඉන්දීය ප්‍රමිතීන්, රෙගුලාසි, ව්‍යුත්පත්ති සහතික ගැනීම ආදී දෑ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු දේශීය අපනයනකරුවන් හා නිලධාරීන් උදෙසා ඉන්දීය රජයේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමටද තීරණය කරන ලදී.

දෙරටම, යෝජිත ගිවිසුමට අදාළ ගිවිසුම් රාමුව 2016 පෙබරවාරි මස ... අත්සන් කිරීමටත්, 2016 මැද භාගයේ ... ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම අත්සන් කිරීමටත කටයුතු කිරීමට එකඟවන ලදී.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හා සම්බර වෙළෙඳ හවුල්කරුවා වේ. 2014 වර්ෂයේදී දෙරට අතර සමස්ත වෙළඳාම රුපියල් බිලියන 4.5ක ඉක්මවා ඇත. එසේම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයනකරුවා මෙන්ම තුන්වැනි විශාලතම අපනයනකරුවා වන්නේද ඉන්දියාවය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පස්වැනි විශාලතම ආයෝජකයා ඉන්දියාව වන්නා සේම ලංකාවේ විදේශීය සෘජු ආයෝජන විශාල ප්‍රමාණයක් ඉන්දියාවේ කේන්ද්‍රගතව ඇත.

දෙරටේ ආර්ථිකයන්හි පවත්නා ප්‍රමාණාත්මක අසම්මිතිකතාව පිළිබඳව සැලකිලිමත් වෙමින් ඉන්දියාව වැනි සුවිසල් වෙළෙඳ සහකරුවකු සමඟ ... නෛතික පදනමකින් යුක්තව වෙළෙඳ කටයුතු පුළුල් කර ගැනීමට යෝජිත ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම හරහා හැකියාව ලැබෙන ඇත.

ඇමති මලික් සමරවික්‍රම අමාත්‍යවරයා පවසනුයේ "ඉන්දියාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හා සමබර හවුල්කරුවා" බවයි. එය කෙසේවත් එකඟ විය නොහැකි ප්‍රකාශයකි.

# දිවයින - 2016 ජනවාරි මස 26 වැනි සෙනසුරාදා

www.divaina.com 34 වැනි කාණ්ඩය 295 වැනි පතුය
පුවත් පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී
දිවයින
2016 ජනවාරි මස 16 වැනිදා සෙනසුරාදා

07

## අකමැති වුණත් කරන්න දෙයක් නෑ

# පිටරටවලින් විශේෂඥ වෛද්‍යවරුන් ගෙන්වනවා



### ඇමැති රාජිත සේනාරත්න

**කුෂාන් සුබසිංහ - ජයම්පති මාරසිංහ**

**රටේ පවතින විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයට පිළියමක් සොයා ගැනීමට නොහැකි වුවහොත් අකමැත්තෙන් වුවත් විදේශීය රටවලින් විශේෂඥ වෛද්‍යවරුන් ගෙන්වීමට කටයුතු කරන බව සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමැති රාජිත සේනාරත්න මහතා "දිවයින"ට පසුගියදා (12 දා) පැවැසීය.**

රටවල් ගණනාවක් ඒ සඳහා කැමැත්ත පළ කර ඇති බවත් ඒ සම්බන්ධ කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

පශ්චාත් උපාධිධාරීන්ගෙන් සමත් වන ප්‍රතිශතය වැඩි කිරීමට පියවර ගත යුතු බවත් විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟය අවම කිරීමට එය මූලික පියවරක් ගෙන ඇති බවත් ඇමැතිවරයා පැවසීය.

විශේෂඥ වෛද්‍යවරුන් පුහුණු කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට පියවර ගන්නා බවත් වෛද්‍ය හා හෙද හිඟයක්ද දිවයිනේ රෝහල් තුළ පවතින බවත් එම හිඟයට කඩිනමින් විසඳුම් දෙන බවත් ඇමැතිවරයා කීය.

# ගිවිසුමට අනුව දෙරටේ සැපයීමට සුදානම් සේවාවන්

**ශ්‍රී ලංකාව විසින් සැපයීමට සුදානම් යෝජිත සේවා ලැයිස්තුව**

1. පරිඝණක සම්බන්ධ සේවා
2. වෙනත් ව්‍යාපාරික සේවා
   a. සම්මන්ත්‍රණ/ නියෝජිත රැස්වීම් ආදිය සඳහා සපයනු ලබන සේවා
3. විදුලි සංදේශන සේවා
4. මූල්‍ය සේවා
   a. රක්ෂණ සේවා
   b. බැංකු සේවා
5. සෞඛ්‍ය සහ සමාජීය සේවා
6. සංචාරක සහ ගමනා ගමන සේවා
7. ප්‍රවාහන සේවා
   a. මුහුදු ප්‍රවාහන සේවා
   b. මුහුදු ප්‍රවාහන උපස්ථායක සේවා

**ඉන්දියාව විසින් සැපයීමට සුදානම් යෝජිත සේවා ලැයිස්තුව**

1. වෘත්තිමය සේවා
   a) ගිණුම්කරණය සහ පොත් තැබීමේ සේවා
   b) වාස්තුවිද්‍යාත්මක සේවා
   c) ඉංජිනේරු සේවා
   d) සංකලිත ඉංජිනේරු සේවා
   e) නගර සැලසුම්කරණය හා භූදර්ෂණ ශිල්පීය සේවා
   f) වෛද්‍ය සහ දන්ත වෛද්‍ය සේවා
   g) පශු වෛද්‍ය සේවා
   h) වින්නඹු, හෙද, භෞතික චිකිත්සක හා සම සෞඛ්‍ය සේවා
2. පරිඝණක සම්බන්ධ සේවා
3. පර්යේෂණ සහ සංවර්ධන සේවා
   a. පර්යේෂණ සහ සංවර්ධන සේවා - ස්වාභාවික විද්‍යාව
   b. පර්යේෂණ සහ සංවර්ධන සේවා - සමාජ විද්‍යාව
4. වතු සේවා
5. බදු හා කල් බදු සේවා
6. වෙනත් ව්‍යාපාරික සේවා
   a. කළමනාකරණ උපදේශන සේවාව
   b. තාක්ෂණික පරීක්ෂා කිරීම් සහ විශ්ලේෂණ සේවා
   c. මත්ස්‍ය කර්මාන්තයට අදාල අනිකුත් සේවා
   d. උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව (මුහුදු යාත්‍රා, අහස් යාත්‍රා හෝ වෙනත් ප්‍රවහාන උපකරණ නොමැතිව)
   e. ඇසුරුම්කරණ සේවා
   f. ගිවිසුම් ගත සේවා
7. විදුලි සංදේශ නියාමන සේවා
8. ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා
9. ගොඩනැගිලි හා සම්බන්ධිත ඉංජිනේරු සේවා
10. බෙදා හැරීමේ සේවා (ජීවී සතුන් හැර)
    a. මුදල් අය කිරීම් හෝ කොන්ත්‍රාත් පදනම මත කොමිස් ඒජන්ත සේවා
    b. තොග වෙළඳ සේවා
11. අධ්‍යාපන සේවා
12. පාරිසරික සේවා
13. සෞඛ්‍ය සහ සමාජීය සේවා
14. සංචාරක සහ ගමනාගමනයට අදාල සේවා
15. විනෝදාත්මක, සංස්කෘතික හා ක්‍රීඩා සේවා
16. ප්‍රවාහන සේවා
    a. මුහුදු ප්‍රවහාන සේවා
    b. මුහුදු ප්‍රවහාන උපස්ථායක සේවා

# ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සඳහා ප්‍රතිපත්තින් මත පදනම් වූ තාර්කික ප්‍රවේශය

## ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ක්‍රමවේදය

**පළමුව**

දැනට ඇති ගිවිසුම් විශ්ලේෂණය කර රටට වාසි වන මගකට යොමු කිරීම.

**දෙවනුව**

ජාතික වශයෙන් වැදගත් අංශ සුරක්ෂිත කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපනය කල යුතුය.

**තෙවනුව**

වෙළඳාම විවෘත වන ක්ෂේත්‍ර වල ආරක්ෂාවට තිබිය යුතු ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම.

**සිව්වනුව**

වෙළඳ ගිවිසුමෙන් අපේක්ෂිත අරමුණු නිර්වචනයකර එළි දැක්විම.

**පස්වනුව**

ක්‍රමවේදය තුල පිලිපැදිය යුත මූලධර්ම ස්ථාපනය කිරීම.

## පිහිටුවීම ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සඳහා වගකිවයුතු අධිකාරිය

1. ජනාධිපතිතුමන් වගකිවයුතු අධිකාරියක් පිහිටුවීම සඳහා ගැසට් පත්‍රය සහ මාධ්‍ය නිවේදනය නිකුත් කිරීම
2. වගකිව යුතු අධිකාරියක් පිහිටුවීම
3. ජාතික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අදහස්, යෝජනා විමසීම සහ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය
4. ජාතික ප්‍රතිපත්තිය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීම
5. ජාතික ප්‍රතිපත්තිය සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම
6. ශ්‍රී ලංකාවට වාසිදායක වන ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් සකස් කිරීම

ISBN 978-955-1928-12-4